4 වෙළුම | 1963 සැප්තැම්බර – 2507 බිණර | 6 කලබ



පටුන

තෙ රුවන

විදිලි මිල — විලියන් ද සිල්වා
[සොයුන් විදු (B. Sc. (Eng.) Lond.)
A. M. I. E. E.]

වාසනාව (…ෝදරයෙකි) — අජිත

පාරිභාෂික පෙළැවිල්ල —

මල් ගොමුව — චන්ද්‍රා ආශුබෝධ

මිහිර — කුමරතුඟු හෙමසිරි

බිලිඳා හැදියාවට හුරු වන හැටිය — අනඳපිය කුඩාතිහි

විදුරු නැණ සමරුව —

වඩු වදන් වැල — කුමරතුඟු මුනිදස්

ශිහිය — සිරි විදුරුනැණ මාහිමි

දුහුන පබඳ —

පහදුව —

කුරුළු විනෝදාව — සිරි දේවනාරායන

නොසැබි පඹපොත — ද. දූ. න. වීරකෝන්

ජීතිය — දමමිත්

පැදි විචිනුව — නුවන්සිරි ජයකුරු

බිනර මස —

මිල ශත 50 යි

යස රඟට අකුරු වැදීම ලැබෙන්නේ

හොඳ පහරුවමෙනි.

හොඳ පහරුවම ලැබෙන්නේ

යස රඟට අකුරු වැදීමෙනි.

මේ දෙක මැ ඔබට ලබා දෙන්නේ

'ස්ටාර්කෝ ප්‍රින්ටර්ස්'

කොලොඹ පිට කොටුවේ
කුමාර වීදියේ – 80.

මඟුලෙහි, උළෙලෙහි, සාදයෙහි

අගය වැඩි වන්නේ

අමුත්තන් සතුටු වූ පමණට යි.

අමුත්තන් සතුටු වන්නේ

කේක් වර්ග රසවත් වූ පමණට යි.

රසවත් කේක්වලට තැන

'පුඩිං හවුස්'

* වැල්ලවත්ත * මොරටුව * බොරැල්ල
* ගල්කිස්ස * නුගේගොඩ * බෙල්ලන්විල

ෆෝන් 84087, 655

තෙ රුවන

මිනිසා දනවත් කරන, එ හෙයින් මැ දිවිය රසවත් කරවන රන්, රිදී, මුතු, මැණික් ආදිය, රුවන් නම් වෙයි. මේ රුවන් කෙරෙහි කවර දත් මිනිසා ගේ ඇලුම්, බැලුම්, රැකුම් බෙහෙවි.

මිනිසියාව ඉහළ නැංවෙත් මැ මිනිසා රන්, රිදී ඈ රුවන්වලට වඩා ඉහළින් සිය දන වගෙහි උසස් පොදු අරමුණු මැ රුවන් අයුරින් තකන්නට වෙයි. හෙළ බස, රැස, දෙස හෙළ තෙ රුවනැ යි මෑතැ යුගයෙහි ගැනෙන්නට වූයේ එ බඳු උසස් මිනිසකු හෙළ වගෙහි පහළ වූ හෙයිනි. සැබැවින් මැ දන වගෙකැ තෙ රුවන බස, රැස, දෙස වෙයි.

හෙළ දෙස හෙවත් හෙළ දිව යනු මෙ රටට ආදියේ සිටැ මැ නමෙකි. ඇයි, මේ දෙස හෙළ දෙස වූයේ? හෙළ රැසට හෙවත් හෙළ ජන මුළට මව් බිම වූ හෙයිනි. ඇයි, මේ රැස හෙළ රැස වූයේ? හෙළ බස මව් බස කොටැ ගත් පිරිසක් වූ හෙයිනි. දෙස, රැස, බස තුනෙහි සැබැඳියාව මින් මැ පැහැදිලි යැ.

හෙළ රැස, හෙළ බස නො වහරවත් නම් ඒ වෙනුවට ඉංගිරිසි, හෝ හින්දි හෝ දෙමළ හෝ එ වැනි අනෙක් බසක් හෝ වහරවත් නම් එ රැසට කිමෙක් වේ ද? ඒ වහරවන බසේ නමින් මැ කල් යැමෙන් ඒ රැස පෙනෙනු ඇති. දෙමළ බස් වහරට යට වැ ගිය උතුරේත් නැගෙනහිරේත් හෙළ රැසට වූයේ මේ යැ. එ සේ වූ කලැ ඒ දෙසට කිමෙක් වේ ද? එ ද වහරවන බස අයත් රැසේ නමින් මැ පෙනෙන්නට වෙයි. සිය මව් බස හැරැ ඉංගිරිසිය වහරන්නට වූ උතුරැ අයර ලන්තය ද, වේල්සය ද මහා බ්රිතානය නමින් ගැනෙන්නට වූයේ මේ නිසයි. දෙස, රැස, බස යන තුනින් බස මැ මුල් වන අයුරු මෙයින් පෙනේ. එ හෙයින් බස මැ දන වගෙකැ පළමු වන රුවන වෙයි. මේ පළමු වන රුවන වූ බස මෙන් මැ රැස දෙස යන අනෙක් දෙ රුවන රැක්මත් ඒ අයත් දන වගේ පරම යුතු කම යැ.

ඈතැ යුගයෙහි මෙහි වන් මාඝ ඈ සතුරෝ කුමක් කළෝ ද? හෙළයා ගේ පතපොත සොය - සොයා කඳු ගස්වා ගිනි ලූ හ. මෑතැ යුගයෙහි මෙහි වන් ඉංගිරිසියා කුමක් කෙළේ ද? හෙළ බස නොසැලැකෙන තැනටත් ඉංගිරිසිය මැ සැලැකෙන තැනටත් උපා සැලැසී යැ. පල කිමෙක් වී ද? හෙළ රැස ගැති බවටත් දෙස පරයන් ගේ ගොදුරු බිම බවටත් වැටිණි.

මාඝාදීන් ගෙන් රට මුදගත් පැරකුම්බා ආදීහු කුමක් කළෝ ද? පතපොත ඇති කොටැ බස නංවාලූ හ. ඉංගිරිසි යුගයෙහි මැ මෙහි පහළ වූ සුමඟුල්, දම්රම්, ඈ පඬිවරුන් බසට කළ සේවාට මහ බස් පෙරළියකට හැරැවූ හ කුමරතුඟු මුනිඳස්හු. පල කිමෙක් වී ද? බස උසස් වත් මැ එ වහරවන රැස ද උසස් වියැ යුතු. එ දෙක උසස් වත් මැ දෙසෙහි ද උසස් වීම නො වැළැක්වියැ හැකි යැ.

බස උසස් වන්නේ කෙ සේ ද? ඒ වියරණ-හුරු වියැ යුතු යැ; එහි නැම්යාව ඇති වියැ යුතු යැ. නීතියක් නැති දන වගෙහි කිසි මැ උසස් කමක් නැත්තා සේ ''මෑගයන් අං දළුයෙන් කර කැස් වූ සේක''යි ලියන වියරණ-යට නැති බසෙහි දු කිසි දූ උසස් කමෙක් නැති.

පර වදනින් සිය වදන් මකා, පර ඌරැ-යෙන් සිය ඌරුව කිළිටි කැරැගත් බස වල් පැළවලට ඉඩ දුන් හේනක් සෙයින් කෙමෙන්

ඒ ආරට මැ යෙයි; එහි පණ වූ නැමියාව මුළුමනින් සුන් වූ දු දරදඬු මළ කඳක් සෙයින් ඉවත් කළ යුතු වෙයි. එ හෙයින් බසේ උසස් කම් රකින්නවුන් එ බසේ වියරණ හුරුව, උෟරුව, නැමියාව රැකැගත යුතු මැ යැ.

රැසේ උසස් බව ඇති විමට නම් කුමක් කුමක් කළ යුතු ද? වියැ යුතු ද? උසස් පොත් පහළ කළ යුතු යැ; උසස් මිනිසුන් පහළ වියැ යුතු යැ. අලුත් නිපැදැවීම් කළ යුතු යැ; රැසේ සැමැනි ගුණ වගාව උසස් වියැ යුතු යැ.

පොත් ලියන්නෝ 'සපුන් හැව ලන්නා සේ' නිසරු පොත් නො ලියති රැසේ ගුණ වගාව උසස් නම්. ඒ ගුණවගාව ඇති කැරුම එ රැසේ කා ගේත් යුතු කම වෙයි. සරු කෙතේ අස්වනු සරු වන්නා සේ ගුණවගාව උසස් වූ රැසේ උසස් මිනිස්සු පහළ වෙති; ගැති හැඟුම් නැත්තෝ වෙති, නිදහසේ සිතන්නෝ වෙති. එහි පල විසින් නව නව නිපැයුම් උන් අතින් දන වගේ යහපත පිණිසැ පහළ වේ.

මේ අතින් අපි අද කො තැනැ ද.? නැඟෙන්-නට බැරි ද අපට? හැකි; සැබැවින් මැ හැකි. උසා කළොත් "මුළු ලොව අගැ දී - හෙළයට පරදී" යනු කියන්නට මෙ ද නොකල් නො වේ ලොව දෙස බැලුවොත් විමැසුම් ඇසින්.

'අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොවෑ නොං නඟී
හිඟා කැම බැරි වුණු තැන ලගී ගයා මර ගී
ගැමි වහරින් හද පොපියන අරුත් රසය නොහැඟී
මහ දද දන ගණ උපදින කලැ පර දෑ අනෑගී'

(-විරිත් වැකිය)

විදිලි මිල

ඊලියන් ද සිල්වා

විදිලිය ඇති ගෙවල් මෙ කලැ බොහෝ යැ. තමන් යෙදූ විදිලිය අනුවැ මසකට වරක් මිල ද ගෙවන්නට වෙයි. එ බැවින් විදිලිය මිල කැරුම කෙ සේ කැරෙන්නෙක් දූ යි වටහා-ගැන්ම වැදූගති. දිය වැනි දැ මිල කැරුම අසීරු කරුණෙක් නො වේ. සැපැයූ ගැලුම් ගණන දතහොත්, ගැලුමෙකැ මිල ද දතහොත් සැපැයූ දියෙහි මිල ලෙහෙසියෙන් දත හැකි යැ. විදිලිය සපයන්නෝ විදිලි එකුවෙකැ (unit) මිල මෙ පමණ යැ යි පවසති. ඉක්බිති වැ ඇත්තේ කෙ තරම් විදිලි එකු සැපැයුවා දූ යි දැනැගැන්ම පමණි. එහෙත් පැහැදිලි දැන්මක් ලබාගැන්මට 'එකුව' යන්නෙන් හැඟැවෙන්නේ කිමෙක් දූ යි දත යුතු යැ.

කම් පමණ (Quantity of work)

රාත්තලෙකැ බරක් අඩියක් තුළැ වැටුණේ යැ යි සිතමු. එ විටැ යම් වැඩක් හෙවත් කමක් වූ සේ සලකති. ඒ වූ වැඩෙහි, කමෙහි පමණ අඩි – රාත්තලෙකි (foot pound). කම් පමණ ගණනුයේ වැරත් (force) එ මැ වැර ගිය දුරත් වැඩි කැරුමෙනි. එ බැවින් වැරෙහි පමණ රාත්තල් දහයෙක් නම් ගිය දුර පමණ අඩි පහෙක් නම් කැරුණු කම් පමණ (10 × 5) අඩි – රාත්තල් පනසෙකි.

කම් එකැගිය (Rate of work)

මේ අඩි-රාත්තල් පනසේ කම කැරුමට තප්පර දහයක් ගෙවුණ හ යි සිතමු. එ විටැ තප්පරයක් තුළැ දී කැරුණු කම් පමණ ($\frac{50}{10} = 5$) අඩි-රාත්තල් පසෙකි. මෙහි දී කැරුණේ සිදු වූ කම් පමණ එක තප්පරයකට අගය කැරුම යි. එකකට අගය කැරුණේ යමෙක් ද ඒ (එක් + ඇගි) එකැගිය යි. මේ එකැගියට ඉංගිරිසියෙන් කියනුයේ "රේට" (Rate) කියා යි. මින් පැහැදිලි වනුයේ කම් පමණ එක් දූයක් බවත් කම් එකැගිය තව ද දූයක් බවත් යැ. ඉහතැ දැක්වූ නිදසුනෙහි කම් එකැගිය තප්පරයකට අඩි-රාත්තල් පසෙක් (Five foot pounds per second), තව අයුරෙකින් දැක්වුවහොත් ත. අ. රා 5. (5. F. p/sec). කම් එකැගිය ත. අ. රා 500 ක් නම් එය එක් අස්-බලයෙකි. (One horse-power), හෙවත් අ. බ. 1. (1 H. P.). එ මෙන් මැ වොත (watts) 746 ක් එක් අස්බලයෙකි.

වොත (Watt)

විදිලි බුබුළෙහි පිත්තලෙන් තැනුණු හිසෙක් වෙයි. මෙ මැ හිසෙහි හෝ බුබුළෙහි හෝ ලකුණු කැර ඇති ඒ බුබුළේ වොත පමණ. එය වොත 15 ක්, 25 ක්, 60 ක්, 75 ක්, හෝ වෙන යම් කිසි ගණනක් වන්නට පිළිවනි. වොත පමණ වැඩි වත් මැ එ මැ බුබුළෙන් තප්පරයකට කැරෙන වැඩ පමණ ද වැඩි වෙයි. වොත 60 කැ විදිලි බුබුළක් සලකමු. එය අල්ලුවෙහි (holder) රඳවා වහරුව (switch) දැමුවහොත් බුබුළ දැල්වෙයි. විදිලිය, තත් ඔස්සේ අවුත් බුබුළෙහි කෙන්ද (Filament) තුළින් යයි. එ විටැ කෙන්ද මහත් සේ රත් වී එළි විහිදයි. විදිලියෙන් කැරෙන කම යැ ඒ. ඒ කමෙහි තරම කෙ තරම් ද? එය අපි නො දනිමු, එහෙත් තප්පරයක් ගණනේ කැරෙන කම් පමණ නම් දනිමු. එය වොත හැටෙකි. තප්පරයකට වොත හැටෙකැ කමක් කරන මේ බුබුළ තප්පර දහයක් තුළැ දැල්වුවහොත් කැරෙන කම නම් (60 × 10 = 600) වොත – තප්පර 600 කි. මේ "වොත" හෝ 'තප්පරය' හෝ මිනුම් දඬුවක් ලෙස බලත ඉතා කුඩා යැ. එ බැවින් මිනුම් පහසුව සඳහා ගනුයේ වොත දහසෙකි හෙවත් දහසු වොතෙකි; තප්පර 3600 කි හෙවත් හෝරාවෙකි. මේ අනුවැ කම් පමණ මනනුයේ දහසු-වොත-හෝරා-වෙනි (Kilowatt -hour). කෙටි විසින්

දක්වනුයේ ද. වො. හෝ (Kwh) යනුවෙනි. එක් දහසු-වොත-හෝරාවෙක් එකුවක් (unit) ලෙස ගැනේ.

විදිලි එකුව (Electrical unit)

විදිලි එකුවකට හෙවත් දහසු-වොත-හෝරාවකට සත දහයක් සමැනි විසින් වැය වෙ. අප ගේ වොත හැටේ බුබුළ හෝරා පහක් දල්වූ හ යි සිතමු. එ විටැ විදිලිය වෙනුවෙන් කො පමණ මිලෙක් වැය වේ ද? වොත හැට, දහසු-වොත $\frac{60}{1000}$ = 0 . 06 කි. හෝරා පසක් හෙයින් කම් පමණ (5 × 0.06) ද. වො. හෝ යැ. එක් ද. වො. හෝරාවෙක් සත දහයෙකි. එ බැවින් මුළු වැය සත 5 × 0.06 × 10 = 3 කි. ගෙදර-දොරේ වැඩට ගන්නා තව ද උවාරණයක් සලකමු. විදිලි මදිනයෙන් රෙදි–පිළි මැදුම කැරෙයි. සමැනි විසින් විදිලි මදිනයෙකැ වොත පමණ 750 කි. දිනකට හෝරා දෙකක් පමණ එ මැ මදිනය යෙදූ හ යි සිතමු. වොත 750, දහසු-වොත $\frac{750}{1000}$=0.75 කි. එ විටැ කම් පමණ 0.75 × 2 = 1.5 ද. වො. හෝ වෙයි. මිල පමණ සත 1.5 × 10 =15 කි. එහෙත් නව පන්නයේ විදිලි මදින දිගට මැ විදිලිය නො ගනී. සුදුසු තරම් රත් වූව ඉබේ විදිලිය ඇණහිටවා සීතල වූ විටැ යළි විදිලිය ඇදගනී. මෙ නිසා, ඇත්තේ හැටියට වැය වන මිල සත පහළොවට වඩා අඩු වෙයි. ළිඳෙන් දිය ඇදූ දෙන විදිලි පිරියතක් (Electric pump) සලකා බලමු. එ මැ පිරියතෙහි සඳහන් කැරැ ඇති එහි අස්බල පමණ. පිරියතේ අස්බලය $\frac{1}{2}$ සේ ගනිමු. මින් හැඟෙනුයේ පිරියතේ කම් එකැගිය අස්බල $\frac{1}{2}$ යන්න යි. පිරියත මෙහෙයනුයේ එයට ඈඳා ඇති විදිලි බමවනයෙනි (Electric Motor).. මෙ මැ බමවනයේ කම් එකැගිය අස්බල $\frac{1}{2}$ ට වඩා මඳක් වැඩි වෙයි. ඇයි? බමවනයත්, පිරියතත් පිළිඑම (පිළි + ඉළුම = Friction) නිසා පලක් නැති වැ බල පමණක් වැය කරයි. එක් අස්බලයෙක්, වොත 764 ක් යැ යි පෙර කීමු. මෙ අපතේ යන බල පමණ ද සලකා එක් අස්බලයෙක් වොත දහසක් සේ මේ නිදසුන සඳහා සැලැකුව සමැනි විසින් හරි යැ. එ බැවින්, හෝරා තුනක් තිස්සේ පිරියත වැඩෙහි යෙදූණහොත් කම් පමණ $\frac{1000}{1000}$ × 3 = ද. වො හෝ 3 කි. මිල පමණ 3 × 10 = සත 30 කි. උවාරණයෙහි අස්බලය හෝ වොත පමණ හෝ දතහොත් ඉහත දැක්වූ අයුරින් කො පමණ මිලෙක් වැය වේ ද යනු ලෙහෙසියෙන් දැනැගත හැකි යැ.

විදිලි මනුරුව (Electricity Meter)

මැනිමක් කරනුයේ යමෙක් ද ඒ (මන් + කුරු) මනුරුවයි (Meter). එ බැවින් විදිලිය මනින උවාරණය විදිලි මනුරුව යැ. මෙහි හැබැ නම නම් දහසු - වොත - හෝරා මනු-රුව යි (Kilowatt Hour meter) ගෙදරට විදිලි සේවාව ඇතුළු වන තැනැ සවි කැරැ ඇති මේ මනුරුව. සමහර විටැ එහි මූණ-තෙහි කුඩා ඔරලෝසු වැනි සයෙක් දක්වේ. ඒ එක් එක් ඔරලෝසුවෙහි කටුවෙක් වේ. බින්දුවේ සිට නවය දක්වා ඉලක්කම් ද ඇති. එක් ඔරලෝසුවෙක් ද. වො. හෝවෙන් සියයෙන් පංගුව ද අනෙක දහයෙන් පංගුව ද ඉක්බිති එක ද. වො. හෝවක් ද ඉක්බිති එක ද. වො. හෝ දසගණන ද යන අයුරින් දක්වයි. මසක් මුලැ දී මනුරුව කියවා දක්වන ද. වො. හෝ ගණන සඳහන් කැරැගෙනැ මස කෙළවරැ දී යළි කියවා එ මැ ද. වො. හෝ. ගණනින් මසැ මුලැ දී තුබූ ගණන අඩු කළ කලැ එනුයේ මස තුළැ දී වැඩට ගත් දහසු - වොත - හෝරා ගණන යි.

වාසනාව

අජිත්

පහතැ පළ වනුයේ පඬු අබා පුවත මැදි කොටැ ගෙතුණු අන්දරයෙකි. මෙය-එළියෙහි දිගට පළ වෙයි. මහවස් කරුවන් අබුතු කරුණින් යුතු කොටැ දක්වන පඬු අබා පුවතෙහි සැබෑ මුහුණුවර මෙ යැ යි දක්වන්නට කැරුණු තැතෙකි, මේ අන්දරය.

සිතිර (චිත්‍ර) නම් යක් දෙටුවා ගේ සොහොවිරිය ගේ දුව හා හුවමාරුයෙන්, පළමු වන මරින් ද, අනුර ගමැ කුඹුක් පොකුණේ දී, දිය රෙදි කඩ සැහැවීමෙන් දෙ වන මරින් ද පඬු අබා කුමරු රැකුණු අයුරු පළමු පැවැසිණි.

අද මින් පැවැසෙන්නේ කුමරා තුන් වන මරින් ගැලැවුණු අයුරු යි.

කුඩගල්හේන නම් ගම එ නමට සියලු අතින් ගැළැපෙන්නෙකි. එ ගම් වැසි දනෝ හේන් ගොවිතැනට 'යක්කු' යැ! වැහි කන්නේ දී මඩ ගොවිතැනේ යෙදෙන මේ යක්කු නියං කන්නේ දී හේන් ගොවිතැනට හිත් දෙති. ගමෙ වනාත එ සමයෙහි හේනෙකැ සිරි ගනී.

ගමේ වැසියන් ගේ පැල්පත් සඳහා දුව දඬුත්, ගිනි මෙලැවුම් සඳහා දර ගිනිත්, අහරට දඩ මසුත් නොමඳ වැ සපයන මේ වනාතට ගම් වැසියන් ගේ ඇල්ම බැල්ම කවර දත් බෙහෙවි.

'හේනක් එළි කරන්නේ වන සතුනටත් ඉඩක් තබා යැ' යන වැඩිහිටි කියමනට හැම ද ගරු කැරෙන නියායෙන් මුළු වනය මැ හේනක් බවට නො හැරෙයි. වනයේ කඩින් කඩැ කැලැ බිමින් අහසට නැඟෙන දුම් පටලය වලාකුළු බවට හැරී හිරු දෙවියන් ගේ මුහුණ මඳකට නමුදු රතු කරන්නේ සොබා දහමට පටහැණි වීම එ තැනින් අනුමත නො කැරෙන නිසා වත් ද?

'මෙ ද කුඩගල්හේනේ සෙස්සනට කෙසේ වෙතත් එහි ගමරාලට නම් හුඟක් මැ සරු පාට යි' යනු ගම් වැසි හේන් ගොවියන් කීප දෙනකුන් ගේ මුවින් පිට වුණු බස යි.

'ගමරාලට ඇයි? මෙ ද අත් උදව්වට ලැබී ඇත්තේ හරි මැ වාසනාවන් කොල්ලෙක්!'

'අන්න ඒකට අපේ කොල්ලො' මුන් අපේ මැ උන් වුණත් හරි මැ මූසලයො! වෙන එකක් තියා කුරුල්ලන් ටික අඹවන කාරිය වත් මුන් ගෙන් හරියට කරවාගන්න බැහැ නොවැ?'

'ගමරාල ගෙ කොල්ලා උගුල් අටවන්න මරුවා ලු! ඔන්න මේ හවසැත් ගෝනකු එළාගත්තා ලු.'

'එහෙනම අපටත් ඒ දිහාවට ගියොත් දඩ මස් වරදින්නෙ නෑ; යමු යමු.'

මෙසේ දෙඩ-දෙඩා මැ ඒ ගම් වැසි හේන් ගොවියෝ එ ද ගමරාල ගේ හේන බලා ගියෝ, ගෝනා මස් කැරුමෙහි යෙදුණෝ යැ.

කැලේ මැ හිඳැ වළඳන විටැ ලු, දඩ මස රස නම්. මේ බව ඒ ගොවියෝ මැනැවින් දත්තු යැ.

''පුතා ගෙදර දිවැ-ගොස් ගින්දර ටිකක් ගෙනාවොත් හොඳ යි.''

ගමරාල මෙ සේ කියා ඉවර වන්නටත් කලින් කොලුවා ගෙදර බලා දුවන්නට හැරී ඉවර යැ.

එ කෙණෙහි මැ වාගේ මස් කළ ගෝනා-ගෙන් ගැලූ ලේ දහර මැ බටහිරි අහසෙහි දු ගලන සැටියෙක් දිස් වී. ලේ වැකි ඇට කැබැලි කුඩු කුඩු වැ විසිරී-ගිය විලසින් සැඳෑ වලා අතරේ අතරින් පතර රිදී තරු විසිරෙන්නට වියැ. මස් ලොල් ගොවි දනන්

කොලුවා එන අත බල-බලා හෙළු නොඉවැසුම් සුසුම් අයුරින් සවසැ මද නල හමා බස්නට වී. කෙසේ වුව ද ගින්දර ගෙනෙන්නට ගම මංඩිය බලා දිවූ කොලුවා නො එන තෙක් මැ ගනඳුර මැ පෙරටු වැ ආයේ මුළු ගමට මැ ළැමෙහෙන අඳුරෙකැ පෙර-නිමිති පළ කෙළේ යි.

මේ අතරැ අඳුරේ අඳුරක් සෙයින් සෙමෙන් සෙමෙන් හේන බලා පිය නගන තව ද පිරිසෙකි. මස් කළ දනන් මස් කරන්නට මෙන් උන් අතැ ඇඳගත් අසිපත් වී.

මේ අතරේ ගම් අඹුවනට එන හද ගින්දරෙකැ ලකුණු පෙන්නූ ගිනි හුළක් වනවනා ලහියේ හේන දෙසට එන කොලුවෙකි. කොලුවා ගේ පිටිපසින් එහෙත් ගසින් ගසට මුවා වෙමින් අසිපත් ගත්තෝ ද හේනට ඇතුළු වූ හ, නියම මස් ලොලුන් ලෙසින්.

ගොවියෝ මහ ගිනි මැළයක් දැල්වූ හ. දඩ මස්, ගිනි මැළයට ළං වත් මැ මස් ලොල් ඌ තුමූ මැළය වටාගත් හ. එ විටැ මැ උන් වටාගත් අසි පත් දරූ සැඩයෝ මුළු හේන මොහොතින් එක මැ මස් ගොඩක් කළ හ.

සැඩයන් පෙරළා පඩුවස් නුවර බලා හැරෙත් මැ ඔවුනට මුවාව දුන් අඳුරේ මැ මුවායෙන් ඒ ගම පියා-යන තව ද දෙ දෙනෙකි.

එකෙක් නම් ගින්දර ගෙනෙන්නට ගමට ගිය ගමනේ පෙරළා නො ගොස්, ගෙදරැ උන් ගම පුතු අතැ මැ ඒ ගිනි හේනට යැවූ පඩු අබා කුමරා යැ. අනෙකා නම් කුමරා හමු වන්නට ගම ගෙදරට එ ද අවුත් සිටි සිතිර නම් යක් දෙටුවා යැ. කුමරා පෙරළා හේනට නොයැවුණේ ද සිතිර ගේ මෙ පැමිණීමෙනි. දෙ දෙනා මැ දුන් මේ යන්නේ පංඩුල නම් රණ ගුරුහු ගේ නාලන්දේ පිහිටි 'නැණ පිල' නම් සත් හල බලා යැ.

(දිගට පළ වෙයි.)

* * *

තස්මිං අහනි ගෝපලා
ලද්ධා ඒකං චතුප්පදං
අග්ගිං ආහරිතුං ගාමං
පෙසෙසුං තං කුමාරකං

සො ගන්ත්වා සරමායුත්ත
පුත්තකං යෙව පෙසයි
''පාද රුජන්ති මෙ නෙහි
අග්ගිං ගොපාල සන්තිකං''

තස්මිං බණෙ පෙසිතා තෙ
පරික්ඛිපිය මාරයුං
සබ්බෙ ගෝපේ මාරයිත්වා
මාතුලානං නිවේදයුං

[එ දවස්හි ගොපල්ලෝ එක්
සිවුපාවකු ලැබූහු: ඌ
නිසා ගිනි ගෙනෙන්නැ යි ගොස්
ගම බලා කුමරා යැවූ.

හෙතෙමේ ගෙට ගොස් ඒ ගෙයි
හිමියා පුතු ඊ යැවී
''රිදෙයි මා පා, යවයි ඉන් තෝ
ගෙනැ මේ ගොපලුන් කරා''

එ කෙණේ එවුණෝ සැත් ගත්
වට ලා ගොපලුන් මැරූ
මරා උන්, එ පවත් දන්වා-
ලූ හ ගොස් මයිලන් හටත්]

— මහාවංසය —

'පාරිභාෂික' පටලැවිල්ල

රජයේ බස සිංහලය වූ ද සිටැ සිංහල සිප් වදන් වෙනුවට කිසි බසකට නැති, කිසි කමකට නැති 'පාරිභාෂික ශබ්ද' යන්නෙක් සිංහලයා පිටැ පැටැවෙන්නේ යි.

'පාරිභාෂායෙන්' වැඩ ගන්නට තැතැනූවෝ අවුලෙන් අවුලට මැ වැටුණෝ යි. එහෙත් පාරිභාෂාව රකින්නට සමහරු තැත් දරූ හ. උනට නිසි පිළිතුරු සපයන්නට දෝ, රජයේ විදිලි අදිකාරියත්, ලංකා මිහිතෙල් මඬුල්ලත් සුදුසු හෙළ සිප් වදන් තනා වැඩට ගත් හ.

ඒ හෙළ සිප් වදන් හැකි පමණින් රටට දෙන්නට ගත් තැතෙකි මේ.

Kilo දහසු
Kilo-amperes දහසු ඇම්පියර
Kilo-ohms දහසු-ඕම
Kilo-Volts දහසු-වෝල්ත
Kilo-volt-amperes දහසු-වෝල්ත-ඇම්පියර
Kilowatts දහසුවොත (*K. W.*) (ද. වො.)
Kilowatt-hour දහසුවොත–හෝරාව (*K.W. h.*) (ද. වො. හෝ.)
King-pin රජැණය (රජ + ඇණය)
Kit කට්ටලය
Laboratary විදුගර
Laboratary, Research පිරියෙයුම් විදුගර
Laboratary, Testing සුවික්සුම් විදුගර
Laboratary test විදුගර සුවික්සුම
Laboratary, Electrical විදිලි විදුගර
Laboratary, Hidraulics දියෙදු විදුගර
Laboratary, Central testing මැදි සුවික්සුම් විදුගර
Lamp පහන
Lamp, Anglepoise නැම්සිටු පහන
Lamp, Cord-grip Suspension යොත-බඳනා එලෙන පහන
Lamp, Discharge සුවිසුරු පහන
Lamp, Electric විදිලි පහන
Lamp, Filament කෙඳි පහන
Lamp, Fluorescent පියරැසි පහන
Lamp, Incandescent තැවිදිලි පහන (තැවී දිලෙනුයේ)
Lamp, Mercury vapour රසදුම් පහන
Lamp, Operating theatre සැත්කම්-හල් පහන
Lamp Shade පහන් එළිවරුව
Lamp Shadc, Bell Shaped සීනුයුරු පහන් එළිවරුව
Lamp shade, Conic ගොටුයුරු පහන් එළිවරුව
Lamp shade, Fancy විසිතුරු පහන් එළිවරුව
Lamp, Shadow-less සේවරු පහන
Lamp, Channel type table ඔරු හැඩ මැසි පහන
Lamp, Street මං පහන
Lathe ලේත (ලිය + යත)
Lay-out (verb) ලාපියයි
Layout (noun) ලාපියුම
Lead covered cable ඊයම් වැසි බහන
Lead sheathed cable ඊයම් කොපුලු බහන
Left hand rule වමත් නිය
Lever (verb) වාරුවයි
Lever වාරුව
Leverage වාරුවම
Lift (verb) ඔසවයි
Lift (noun) එසැවිය
Lift, Electric විදිලි එසැවිය
Lift guide rails එසැවි නුයැවි පීලි

Lift door එසැව් දොර
Lift well එසැව් වළ
Lift, Service සේවා එසැවිය
Lift, goods බඩු එසැවිය
Lift, passenger මැඟි එසැවිය
Lift counterweight එසැව් පිළිබර
Lift motor එසැව් බමවනය
Lift, Automatic සියසල එසැවිය
Lift, Push-button තදලු එසැවිය
Lift, Highest call return
ඉහළම කැඳැවුම් පිළියැව් එසැවිය
Lift room එසැව් කිළිය
Litf cage එසැව් පැස
Light (verb) දල්වයි
Light (noun) එළිය
Light-house එළිගර
Lighting එළියනය
Lighting, Street මං එළියනය
Lighting Emergency හදිසි එළියනය
Lighting, Public ජන එළියනය
Lighting, Stage කරෙළි එළියනය
Lighting, Yard පිටි එළියනය
Limit (verb) ඉම්කුරයි
Limiter ඉම්කුරුව
Limit Switch ඉම්කුරු වහරුව
Limit switch, Final නිමා ඉම්කුරුව
Line රැහැන
Line, Overhead උඩුහිස් රැහැන
Line Underground යටිබිම් රැහැන
Line, Power බල රැහැන
Line, Hot පණ රැහැන
Line, Service සේවා රැහැන
Line, Single Phase එක්-කලා රැහැන
Line, Three Phase තෙ-කලා රැහැන
Line-Shaft පෙළදඬුව
Line voltage රැහැන් වෝල්තතාව
Line fault රැහැන් දෙස
Line carrier, Power බල රැහැන් දරායැවිය
Link (verb) ආඳයි
Link (noun) ඇඳිය
Linkage ඇඳියාව
Linked swich ඇඳු වහරුව
Lampholder plug අල්ලු-ඔබුව
Lighter දල්වනය
Load බැර
Load, Non-reactive නොපිළිකුරු බැර
Load, Reacture පිළිකුරු බැර
Loop පුඩුව
Liquid දියර

* * *

"හෙළයන් අබිමුවැ
හෙළ අදහස් හෙළ බසින්
හෙළනු බැරි නම් කො තෙක්
පර බස් දත ද කුමට යැ?"

— කුමරතුඟු මුනිදස්

මල් ගොමුව

චන්ද්‍රා ආශුබෝධ

I

වැල් ගොමුවෙ
මල් මෙනෙවිය
ඇගෙ ලස්සන
මිහිරි මූණ
දක්වන්නට
වුණා ම-හට.

සුවඳ දූතිය ද රහසින්
මා වෙත එවුවා නිතර මැ.
බිහු රැව් පෙම් බස් බිණුවා
වැල සතු ඔ දූන් ම- සතු යැ.

පැහැසියෙමි, පැහැසියෙමි
ඇගේ මොළකැටි සිරුර.
සිඹැ-පිමි, සිඹැ-පිමි
රිස්ස යන තුරු මැ වත.

පුරා – ගතිමි
මගෙ මන දෙළ.
කෝ දූන් ඇගෙ
ඒ ලස්සන!

II

මම එබුණෙමි
මී වදයට.
ගුමන බමන
කෙළින නටන
මී මැස්සෝ!
මී මැස්සෝ!

මම එබුණෙමි
මී බඳුනට.
මුමුනන වැලැ-
පෙන දහලන
මී මැස්සෝ!
මී මැස්සෝ!

මිහිර

කුමරතුඟු හෙම්සිරි

මි හි ර යි කියන දය
සොයුමින් නොයෙක අත
සි හි නැති එකකු මෙන්
දිවැ යන කලට හිත
කොහි වත් යා නොදී බැඳැ-ගත්
කමල වත
ගි හි සැප පිණිසැ දෙනු
යෙහෙ මගෙ අතට අත

ලැබැ ගෙන උදැසනැ සිහිලස මිහිරිතම
පි බි දෙ න සුවඳ මලෙකැ'ත්
නම් දිනැ මැ හැම
ඔ බ ගැ න මතක ඇකි වන
හැම මොහොතෙකැ ම
දි වැ ගෙ න ගොසින් ඒ මල
සිපැ-ගනිමි මම

බ ම රු න් සමනළුන් මල්
පැණි පිණිසැ සොයා
ගු ව නි න් යන ගමන් කුඩ
මගෙ කනට තියා
ඔබ ගෙන් හාදුවක් ඉල්ලන්නට
යැ කියා
ර හ සි න් කියා යළි විගසින් ඉගිලැ ගියා

සු ළ ඟි න් සැලෙන තුරු ලිය
නෙක් අතට නැමී
ඔබ ගෙන් නැටුම් විනයනවා
බඳු යැ වම්
වි හ ඟු න් එ මතැ නැඟැ දෙන රාවය ද හිමී
එ ක ති න් ඔබට බව යෙමි
නෙත් දියෙන් තෙමී

ව ලා කුළක් ගිරි මුඳුනේ හැපෙන විට
ග ලා යන නදිය සිඳු වෙල සිඹින විට
පු ලා වැලක් තුරු අතු අතැ වෙළෙන විට
බ ලා මම හිඳිමි වැඳූ සිහි මුළාවට

අද ඇති වුණා හදු පෙම මතිනො'බ දුටුව
ඉඳු බැති හිතින් අවයට මුත් ඔබ කැටුව
විරු ගති පපා යෙමි මගෙ සුර මල් ගොටුව
ඔබ නැති ලොවෙකැ මට හිමි වේවි ද තුටුව

නෙ ර පා දමා හැම අදිරදවරුන් සෙට
ලො ව පා ලනය දී එහි ඇති නෙ මුතු කැට
ම ගෙ පා ළහට ගෙනැදුන්නත් එකතු කොට
ඔ බ පා රද පමණ නො වටී සොඳුර මට

බිලිඳු හැදියාවට හුරු වන සැටිය

අනඳපිය කුඩාතිගි

මුලින් මැ බිලිඳා හැදියාවේ බල පැම් ලබන්නෙක් පමණි. නිවෙසේ රැකවරණ ලැබීමේ වටපිටාවෙහි වූ සිතිවිලි වැලට යැ ඔහු හුරු වන්නේ. කල් යත් මැ මෙ වටපිටාවට හුරු වීම හැඳුණු බව දක්වා පුළුල් වෙයි. මෙ පෙරළියේ දී හේ වැඩකුරු කොටසක් ඉටු කරයි. තැනැති වැඩපල තුළින් හේ විසල් හැදියා මුළුවට එකතු වෙයි.

අටලොස් වියෙහි සිටැ හේ ගෙදෙර වටපිටාවෙන් බැහැරි ඉමට ගමන් කරයි. ඇතැම් විටැ හේ බිලිඳු පාසලකට ද යයි.

වසරක් පාසා හෙතෙම රැසේ දිවිය හා කෙමෙන් තර වැ බැඳෙයි. ගෙදෙර වහලෙන් එ පිටැ ඇති විසල් ලොව ගැනැ ඔහුට මඳ වැටැහීමෙක් ඇති වෙයි. ඔහු ගේ ඇසුර ලියුම් බෙදන්නා එළවුළු වෙළෙන්ද ඈ මිනිසුන් දක්වා විහිදෙයි. වෙද ගෙදරට ද හේ ඉඳැහිටැ යන්නේ වෙයි. එ අයුරු, ඔහු මුල සිටැ යළි ලබා ගත යුතු, තමන් උපන් හැදියාවේ පෙලැඹීම් සේයාවන් කෙරේ ඔහු ගේ ඉව දිවෙයි.

හේ දූන් එක පවුලෙකැ දරුවෙක් නො වේ. සෙසු දෙමාපියෝ, වැඩිහිටියෝ හා දරුවෝ ඔහු ගේ ඇසට ලක් වෙති. සෙසු ළමයින් කරන කියන දෑ දක්නට ලැබෙයි. සෙසු ළමයි ලී පතුරින් සෙල්ලම් ගෙවල් තනති; රඟ තවරති; නටති; ඇවිදිති; සගයුවට කන් දෙති; ගී ගයති; ඔවුන් ගේ මැ දෑ පාසලට ගෙනෙති; වෙණෙඳම් පළ, ගිලන් හල නළුවමින් දක්වති. ගෙදෙර දී ලෙසින් මැ නොසිදු වන දෑ සෙසු ළමයින් කරනු දිසෙයි. සෙසු ළමයි නන් අයුරු හැදියා විදි වෙළපති. ඒ දකින අනෙක් ළමයි ද එයට හුරු වෙති. හුරු පුරුදු විමේ මුල් පදනම මෙය යි. මෙ ඉදිරියයු ගමනේ දී ඊට ඇවැසි එකමුතුව ද වටපිටාව ද සැකැසීම වැඩිහිටියන් සතු යුතුකම යැ. සමූහ දිවියේ දී ඇති වන කරුණු වැටැහීම සහ නොවැටැහීම තුළින් ළමයා ජන රැසට (සමාජයට) හුරු වෙයි. ඒ තමා හැඳුණු බව.

ළමයා ගේ තැනැති වැඩීමෙ දී ඔහු මිනිස් වග ගමන් කළ හැදියා යුග මැ පසු කරති යි ඇදූහු 'හැදියා යුග නියාව' නමැති නියාවෙක් ද එ කලැ වී. නොහැඳුණු යුගයේ සිටැ වනසරු යුගයටත් එ තැනින් හැඳුණු යුගයටත් ඔහු ගමන් කරති යි ඇදූහීම යැ ඒ නියාව. ගස්, මුල් උදුරා කෑ යුගය, දඩයම් යුගය, සතුන් අල්ලා - ගැනීමේ යුගය, එඬේර යුගය, ගොවි සහ වෙළෙඳ යුගය වැනි කෙමෙන් පැමිණි හැදියා පිරිනමු යුගයන්හි ද ළමයා ගේ කෙළි නළු විලස්හි ද සමකම - ගනු ලැබී යැ. දූන් නම් එ වැනි සම කම් පොත් පිටු අතරේ මිසැ අන් තැනෙකැ දක්කැ නොහැකි යැ. නව හැදියාව ළමයා කෙරේ ඉතා අසල් වැ බලපාන්නේ යි. එ නිසා, ඔහු විදිලි ඇණයක් තද කරන විටැ, රෙදෙයුවේ තරහ මාරු කරන විටැ ඔහු ගේ දකුම් සේයාවේ ඉම විහිදෙයි. කෙසේ වුව ද ගේ පිටුපසැ සෙල්ලම් ගෙහි දී, ආදියේ පැවැති වඩු වැඩ පිළිබඳ ඉකුත් වත් සිහියට නංවමින් දෝ ළමයා නන් ආරේ යම් යම් දෑ ඉදිකරයි. වත්මන් ළමයා කඩින් කඩ හෝ නොසැබෑ හුරු කොටස් විසින් හෝ හැදියාව එක් රැස් නොකරනුයෙන්, හැදියා යුග නියාවේ දහයියා ගොඩෙකැ ඇති සස් බීදක් සේ සැබැවක් නැත්තේ ද නො වේ. වැඩ ගැනීමෙ සබාහුරු පිළිවෙළ බලා හෝ, කෙළි බිමෙහි දී නළුවමින් දූකැ හෝ, වත්මන් ළමයා ඔහු ගේ හැදියාව අනුවැ වැඩෙයි. කලාව සහ නැටුම් වෙසෙස් වටහා - ගැනුමත්, පැටැලිලි සහිත හැදියාවේ සොබාවට පුරුදු විමත්, ඔහු ගේ ඉඳුරන් මේරීමේ නීතියට යටත් වැ සිදු වන ඉදිරියයු ගමනෙකි. තමන් වට කොටැ-ගත්

හැදියාව කෙරෙහි සිය තෙරුපුම දක්වන ඔහු ගේ නිමැවුම් කිරියාවෙන් මතු දක්කැ හැකි යැ.

තෙරුපුම ඇති වනුයේ උපතින් මැ තත් අතේ නිමැවුම් කරුවකු වන ඔහු ගේ මැ රිස්සෙනි. හැදියාහුරු වැ කියතොත් ළමයා දුහුනෙකි. එය සිත්හි තබා-ගෙනැ බලන විටැ ඔහු තත් දැ කෙරෙහි දක්වන රිසිය, කිසිවක් දෙ වැනි වර කරත් දී දක්නට ලැබෙන පිරිපුන් බව, සොයාගැනීම සහ නිපැදූවීම සැබැවින් මැ විස්මකුරු යැ. මේ කම්කරු කමට (Workemanslip) හා තරමක් දුරට බැඳුණු කීකරු කමට හා පින් සිදු වන්නට ගේ ගෙදෙරට හුරු වෙයි. එ මඟින් මැ කීකරු වූ හැදියාවට ද හුරු වෙයි.

හැදියාව බලයෙන් වැද්දියැ නො හැක්කැ. එය එක් එක් පරපුර විසින් වැර වඩා ලබා-ගත යුතු යැ. විය පත් විමේ දී වැඩෙන නියාව හා බැඳුණු කිරියාවන් මඟින් මදින් මඳ ගේ එ තැනට නැඟෙයි. හැදියා පිළිවෙළත් උපන් හැකියාවත් අතර දක්නට ලැබෙන තැනැති වෙනස ඉමහත් යැ. හැකි-යාවේ එ වැනි වෙනස් කම් ජනරැසබැඳි (Social) වැදගත් කමක් උසුලති යි වත්මන් ලොව ඉගෙනැ-ගනියි. පාසල් වියට කලින් මැ එ වැනි වෙනස් කම් දක්නට ලැබීම සුලබ යැ. ළමයා පාසල් වියට පත් වන්නට ද පෙර මැ හැදියා සහ නිමැවුම් හැකියාවන් පිළිබඳ තත් විදියේ උපන් හපත් කම් අපට යම්කිසි දිනෙකැ හඳුනා-ගන්නට හැකි වෙයි. මෙ මැ හැකියාවන් ගෙදෙර දී මැ මැනැවින් පෙනෙනු වියැ හැකි යි. එ මැ පෙරළියට පොලඹවන සුලු වටපිටාව, හැදියා එකතුවෙන් - එ නම්, අසල් වැසි කෙළි බීමෙන් හෝ ළදරු පාසැලෙන් - සැලැස් වියැ යුතු යැ. ළදරු පාසල දැ-බැඳි හැදියාවේ සොබාව ඉතා සැනෙවින් ඉදිරිපත් කරයි. පහතැ සඳහන් වෙසෙස් ලකුණින් හෙබි මේ සොබාව ඉතා පැරණි හැදියාවේ සිටැ අද පවත්නා අප ගේ හැදියාව තෙක් සියල්ලට මැ පොදු යැ:-

(1) **කතාව**:- බස, ලියන විදිය ඈ (2) **බඩු වෙසෙස්** (අහර විදි, නිවහන්, ගමන් බිමන්, ඇඳුම්, අවි, උවාරණ, රැකියාවන් සහ තත් කම්) (3) **කලාව**- සෙල් නෙළුම, රඟ ගැන්වීම, සිත්තම ඇඳිම, සගයුව ඈ (4) **විදු දැනුම**. (5) **ඇදැහිලි වත්** (වැඳුම් පිදුම්, ලෙඩුනට උවටැන්, මළවුනට පිළිවෙත් (6) **පවුලේ සහ ජන රැසේ සිරිත්** (විවා විදි, නෑ කම් පැවැත්වීම, උරුමය, ජන පලුවම, කෙළි නළු) (7) **දේපළ** (සැබැ සහ තැනැති වටිනාකමේ සහ හුවමාරුවේ තරාතිරම වෙළෙඳාම) (8) **රජය** (දෙස් පලු විදි, අදියුරුව සහ නිති පිළිවෙත්) (9) **යුදය**.

අද පවත්නා මෙ හැදියා රුවෙහි නන'යුරු කොටස් විවිසා බලා, පාසල් වියට නොපත් ළදරුවා ගේ සමූහ දිවියට එ මැ කොටස් කෙතරම් ඇතුළු වේ දැ යි බලා-ගැනීම සොම්නස ගෙනැ-දෙයි. ළදරුවා සිය සපත් කමෙන් මැ පිරිපුන් හැදියාවක් නිමවන්නේ වත් එළිදකින්නේ වත් නැති නමුදු ඔහු මේරු හැදියාවෙන් යැපෙන්නෙක් ද නො වේ. හේ, හැකි හැකි ලෙස හැදියා කටයුතුවලැ නොවක් සිතින් යෙදෙයි.

ඔහුට වඩා ඉහළින් වූ කටයුතු කෙරේ ඔහු ළඟා වනුයේ නළුවමෙන්, වෙළැපුමෙන්, සිත්-තම් සහ කතා පබඳ මඟිනි. උලොළු සහ පින් කම නිසා හේ හැදැහියාවට (ආගමයට) මඳක් ළංවෙයි. රජය හා යුදය හා ඔහු ගේ දැනුමට නොළං වන නමුදු එ මැ කටයුතුවලැ සේයාව ද මඳ විසින් වුව ද පෙනෙයි. ළමයා අටළොස් මස් විය ඉක්මවත් මැ ඉදිකැරුම, රඟ තවැරුම, මාදිලිය, සගයුව, සිත්තම, පොත්, නළු බස, උවාරණ, සතු කැරැගැනුම සහ බෙදා-හදා-ගැනුම, පිංකම් සහ උලොළු යන දැහි ඔහු ගේ හැදියා සහ නිමැවුම් සපත් කම් සැලැකියැ යුතු මට්ටමකට පැමි-ණෙයි. පස් වස් වියට පා තබත් මැ ජන රැස බඳ ළමයා ගේ දැනුම සෑහෙන තරමකට මෝරයි; හුරු පුරුදු වීම එක්තරා මිම්මකට පැමිණෙයි.

පාසල් වියට නොපත් ළමයා, ගෙවන විය අනුවැ, බෝනික්කකු සමඟ සෙල්ලම් කිරීමේ විදියෙන් මේ උකහා-ගැනීමේ දියුණු මැනැගත හැක්කැ. ළදරු පාසලේ කොනෙ-කැ බෝනික්කකු, සෙල්ලම් තොට්ල්ලක් සහ පුටුවක් තබා බලනු.

18 මස් බිලිඳා:- තොට්ල්ල මතැ පෙරළෙයි. බෝනික්කා කකුලෙන් අල්වා පසකට ඇද්ද-දමයි.

2 වස් බිලිඳා:- වෙනස් මැ විදියෙකින් බෝනික්කා අල්වා-ගෙනැ හිස පහළට සිටින සේ තබයි. ඇතැම් විටැ හේ බෝනික්කා තොට්ල්ලේ හොවා, ඔහුට උණුසුම ලබා දෙන සිතින් වසුනා ගලවා දමයි.

3 වස් ළමයා:- බෝනික්කාට සළු පළඳවයි; ඇතැම් විටැ සළු පෙරළයි; බෝනික්කා පුටුවේ හිඳුවා ඔහු අමතා කිසිවක් කියයි.

4 වස් ළමයා:- වෙනස් තතුවක් රඟපායි. හේ වෙදකු ඇඳ ළඟට කැඳවා ලෙඩා ගේ උණ බලන්නේ ද වෙයි.

5 වස් ළමයා:- තොට්ල්ල සහ බෝනික්කා අසරින් අමුතු මැ වටපිටාවක් මවයි. ගිලන් හලෙකැ වාට්ටුවක් මවන හේ එය එක් දිනෙකැ සිටැ පසු දිනට ද ගෙනැ යයි.

අටළොස් මස් වියෙහි දී මෙන් ළමයා දැන් එක් මොහොතෙකැ සිටැ තවත් මොහොතක් දක්වා වෙසෙන්නෙක් නො වේ.

(ආනල්ඩ් ගැසල් ගේ 'වත්මන් හැදියාවෙහි බිලිඳා සහ ළදරුවා' "Infant & child in the Culture of Today' නමැති පොත ඇසුරිනි.)

විදුරුනැණ මා හිමි සමරුව

ගි හි ණි සිල් සුවඳ මුවරඳ සොඳුරු බණ
හැළි ණි කුසුම පිනැවූ බිඟු ඇඳුරු ගණ
ර ම ණි බුදු සසුන් උයන මැ අඳුරු විණ
නැඟිණි බඹ ලොවට හිමි සඳ විදුරු නැණ

බු දු බණ හෙළ බසින් විසිතුරුවට කිව්වා
ඇ දු රිඳු ගුරුළු වෙස් පැ එ මැ බණ ලිව්වා
කඳු නැහැ නහිනුවන් හට හිණි මං ලැව්වා
අ දු රට කුදිටු හිර සඳ දහසක් මැව්වා

පිළි රිසියනට නො මැ කීයේ සිවුරු බණ
පිළි[1] සිවුරින් මැ ඇරැපැයේ සිවුරු ගුණ
පිළි පැද්ද පිළිපැදෙන අයුරින් කී යැ බණ
පිළි වෙත බුදු සසුනැ හිමි සඳු ගෙන් රැකිණ

නයු වන් හෙළය හෙළි කළ එ දවසෙහි උසු[2]
හිමි ඉන් නා තැනට වන් සැටි වෙසිනු'වසු[3]
විය තුන් ඇවැසි වූ කලැ සිය නැණට ඔසු
ඔබැවන් අයුරු පුදුම යි හිමි වෙසිනි සිසු

යුරොපා අමෙරිකා මහ දිවයින්වලැ දූ
හිමි පා[4] යස සුළඟ අවුසත නැණ මුහුදු
එහි[5] පා තරඟ රඟ නැඟි[6] දන ම-හිමි සඳු
සිරි පා වෙලැ[7] හැපී මහ තෙර පදවි ලදු

දහ සක් වසරෙකින් මතු හෙළයෙහි පහළ
විල සක් පැ පැරැණි යතිවරයකු ගෙ පළ
එළි සක්[8] විදුරු නැණ පහනින් සමිඳු අළ
බොඳුසක් වළ කෙරේ මැ යැ සසුන'ගට[9] දුළ

1. නැවැතැ
2. උසස් බව ඇති [උස් + උ]
3. වෙසින් + උවසු [උවසු (උපාසක) වෙසින්]
4. හිමි පාණන් ගේ
5. එ මැ නැණ මුහුදු වලැ
6. තරඟ (රළ) රඟ (අයුරු) පා (පෙන්නා) නැඟුණු
7. වෙරළෙහි
8. එළි රැස
9. සසුන් + අගට

වඩු වදන් වැල

කුමරතුඟු මුනිදස්

ශ්‍රීය ජනවාරියට පළ වූ අධ්‍යාපන ප්‍රවෘත්ති-යෙහි, පළ වියැ විනැයුම් මඩුල්ලෙන් සැලැකෙන වඩු වදන් වැලෙක්. මදක් විමසමු.

බස නම් දූයෙකු අයිතියෙකි. එහි දූයේ මුහුණුවර පුරා පෙනියැ යුතු යැ. සකුයෙහි හෝ වඟුවෙහි හෝ හිංදියෙහි හෝ මහ ගොර හැඩි වදන් එ සේ මැ ගැනීම දූයට මහ මදි කමෙකි. අප ගේ ද අපට මැ හුරු වදන් වී ද නො වී ද යනු මැනැවින් සලකා බැලියැ යුත්තේ යැ.

Technical Terms යනු මැ ගෙනැ විමසමු. යවන (ග්‍රීක්) බසෙහි Texnikos යන්නෙන් නිපන්නේ යැ Technical යනු. Texnikos යනු ද සකුයෙහි 'තක්ෂ්ණෝති' යන ආදි පැවැතුම පද නිපදවන 'තක්ෂ' පවතුයෙන් වූයේ යැ. එහි අරුත පැහැදිලි යැ. නො වේ ද හෙළුයෙහි මෙ අරුත මැ දෙන වදනෙක්? ඒ නම් 'වඩු' යනු යි. 'තක්ෂක' (Carpenter) යන අරුත මැ දෙන්නෙක් නො වෙ, වඩු යනු. ඉංගිරිසියෙන් Worker යනු ද හෙළුයෙහි 'වඩු' යනු ද සම අරුත් ඇත්තේ යැ. උළු වඩු, හී වඩු යනාදිය පිරික් සන්නේ යැ. හැම කම මැ හෙළුයෙහි වඩු නම්. 'සකුයෙන් හෝ පාලියෙන් හෝ දෙමළුයෙන් හෝ සියල්ල බිඳියැ යුතු යැ. හෙළයා මුළු මැනින් මැ පරගැත්තකැ' යි සලකන්නට වන්නෝ වසන්නට බැලූ හ 'වැඩ' යන්නෙහි නියම හෙළ අරුත.

යහපතක් සිදු කරන කවර කමකට වුව ද වැඩ නම යෙදේ. වඩ පවතුව (දූය) යෙදෙනුයේ එ බඳු කමක් කිරීමෙහි යැ, වඩනුයේ වඩු. Technician.

'වඩු' යන්නෙහි නියම හෙළ අරුත මෙ සේ හෙළි වූ කලැ Technical Term යන්නට 'වඩු වදන්' යනු ඉතා සුදුසු බව කෙණෙකින් වැටැහේ. නො වේ ඒ අමුත්තෙක්. කෙසේ වුව ද ගම්මු නම් 'වඩු බස්' යනු අද ද වහරවති. එ බන්දක් තිබියැ දී 'පාරිභාෂික ශබ්ද' යන්නක් ගැනීම අපේ හෙළ බසට අවමන් කිරීමෙක් නො වේ ද?

Mathematics යන්නට 'ගණිතය' යනු සුදුසු නම නො වේ. 'මිනුම් සතර' යනු පෙර සිටැ වැහැරුවෙන්නෙකි. 'මන' පවතුව පමණ බැලුම්හි යෙදෙයි. මනනුයේ මනු යි. එ හෙයින් Mathematics යන්නට නියම හෙළු නම 'මනු' යනු යි. ගණනින් මැ මනනුයේ 'ගණන් මනුව' යි. Arithmetic ලැකියෙකින් – ගණනක් වෙනුවට යෙදු ගත් අකුරෙකින් – මනනුයේ 'ලැකි මනුව' යි. Algebra. දිය (පොළොව) මනනුයේ දේ මනුව යි. Geometry. තෙකොනු (triangles) මනනුයේ 'තෙකොනු මනුව' යි. Trignometry.

සැලැකැවුණු වඩු වදන් අතරෙහි දෙ ලෙසෙක් පෙනේ. ඇතැමෙක් ගොර මැ ගොර සකු යැ. ඇතැමෙක් හොඳ මැ හොඳ හෙළු යැ.

සකු	හෙළු
ඝණ්ඩය	උස
විජ ප්‍රකාශනය	මූළු මුදල
ඝණ්ඩ ජ්‍යාමිතිය	මුදුන
ප්‍රතිලසු ගණකය	වරහන්
සන්නිකර්ෂණය	ගැණ බැලීම
ස්පර්ශෝන්මුඛය	මුල් මුදල
ද්විපදික ප්‍රමේය	වැල් පොළිය
ස්පර්ශ ජ්‍යාය	පසු පද
එක රෙඛිය	හරස් කැපුම
මධ්‍යාවව බහු අශ්‍රය	බෙදුම
නිර්දිෂ්ටය	ඉවත් කිරීම
දර්ශකශ්‍රේණිය	දිගටි කවය
ලඝුගණක සූත්‍රය	හුවමාරුව
සාපේක්ෂ අඩික	කෙළවර
අචල ලක්ෂ්‍ය	කුඩා කිරීම

ප්‍රති විකාශය	බෑවුම
වර්‍ග සඞ්ගුණකය	ඇතුළු
හරාත්මක	ඉහළම ගණන
මධ්‍යමාන අනුපාතය	පෙරළීම

බෑලුව මැනැවි වෙනස. ඇයි ගොර සකු වදන් පෙළටත් කොමළ හෙළු වදන් සොයන්නට බැරි? ඇතැම් විටැ වහරින් මැ සොයාගත හැකි වෙයි.

මෙය හා සසඳා බලන්නැ පහතැ දැක්වෙන දෙමුහුණු වදනුත්.

සුළු කෝණය	සම්පාත වෙනවා
පොදු ජ්‍යාය	ඉරත්ත සඞ්ඛ්‍යා
ඇතුළු ප්‍රතිමුඛ කෝණය	
ඉතා සුළු ගුණාකාරය	
පොදු සරල ස්පර්‍ශකය	

සැබවින් මැ මෙ වදන් සැපැයුවවුනටත් කිනියක් නො දැනේ ද? මෙ බඳු දෑ නො කළ මැනැවි. මෙයින් අපේ කොමළ හෙළ බසට වියැ හැකි මහ වනස සැබැවින් මැ පැහැදිලි වියැ යුතු යැ.

සලකවනු ලබන වඩු වදන් මෙ සේ කලින් මැ පළ කොටැ රටට ද දැනුම් දුන් සේ හෙවු යැ.

සලකා බැලීම පිණිසැ වඩු වදන් කිහිපයක් පහත සඳහම් හ.

Addition	හියෙදුම
Subtraction	- වියෙදුම
Multiplication	වර හියෙදුම, වැඩුම
Division	වර වියෙදුම, බෙදුම

Angle		කොනුව	
Acute	,,	අඩු	,,
Obtuse	,,	වැඩි	,,
Adjacent	,,	එක්බිති	,,
Alternate	,,	එකෙක්බිති	,,
Corrplemestary	,,	පුරු	,,
Corresponding	,,	සරිලු	,,
Exterior	,,	බැහැරි	,,
Interior	,,	ඇතුළු	,,
Included	,,	ඇතුළත්	,,
Opposite	,,	ඉදිරි	,,
Right	,,	සම	,,
Straight	,,	{ඉඳුරා	,,
		එල්ල	,,
Supplementary,		ඇදි	,,
Vertical	,,	මුදුන්	,,
Theorom		තේරුම	
Bisector		දෙසිඳුව	
Chord		රැහැන	
Circle		සිසාරුව	
Coincide		සැසැදෙයි	
Abstract		වෙන්	
Concrete		බැඳි	
Cone		තුඹුව	
Curve		නැමුම	
Cylinder		වට කඳ	
Diagonal		දෙකොනැලි	

මෙ කිහිපයෙකි. දක්වන ලද්දේ හුදු හෙළුයෙන් මෙ වදන් ලැබියැ හැකි බව පෙන්වන පිණිසැ යැ. මින් කීයෙක් හෙළුවට නුහුරු ද කීයෙක් හොඳ හෙළුයෙහි නො වන්නේ ද යන පිරික්සීම වටි.

— සුබස (1941. 3. 24)

[කුමරතුඟු ගෝමින් ගේ අවසරයෙනි.]

සිහිය

පැළෑනේ,
සිරි විදුරුනැණ මහ නා හිමි

ඇසූ දුටු සිතූ ගත් 　තොරතුරු
වියැකියැ නො දෙමින් 　අබතුරු
නැවැතැ සලකවන 　නිරතුරු
ගුණයෙකි සිහි නම් 　විසිතුරු

මෙ සිත් සතන් සැඩ 　වතුරේ
සිතිවිලි රළ පෙළ 　අතුරේ
නැණෝ'රුව රඳවන 　සුතිරේ
රිට නම් සිහිය යි 　මිතුරේ

හැම දෙර එක මුරකරු 　සේ
ස-දෙර මැ බලමින් එක 　සේ
ගුණ බඩු සුරකින නිසි 　සේ
දෙරපලු සිහි යැ යි පැවැ 　සේ

වක් කඩැ සහවාපු 　හකුරු
ඉක් මහට මැ වියැකෙන 　යුරු
දක් ස දනුම සිහියෙන් 　දුරු
එක් සැණෙකින් වේ යැ 　අඳුරු

පර හට බණ දෙසන 　උගත්
පරසිඳු මහ 　දැනුමැතියොත්
සිහි ගිලිහීමෙන් 　නොයෙකුත්
යුහුසුලු කම් කොටැ 　ළ-තවත්

මහ පඬි කම් නොමැති 　අයත්
සිහි විමැසුම් ඇති වුව 　හොත්
කලබල නො වැ කො තන්හි 　දිත්
සැනැසිලි ලබති යි 　පවසත්

සිහි ඇති තැනැ ඇති 　ඉවැසිලි
සැනැසිලි පිය බස් 　විමැසිලි
සත්සුන් තැන්පත් 　පැවැතිලි
හැම මොහොතෙහි 　නොපසුතැවිලි

සිහි නැති තැනැ ඇති 　පැටැලිලි
ගෙරැවිලි දත් සැපිලි 　රැවිලි
සැහැසි වහසි දෙඩිලි 　හැඩිලි
තැතැනිලි ළ-තැවිලි 　කෙඳිරිලි

සිහි ඇති විටැ නින්දෙහි 　දිත්
සැලැකෙයි වන සියලු 　පවත්
සිහි නැති විටැ ඉණේ 　වතත්
නො දනෙයි ඇති නැති බව 　වත්

කෙළෙහී ගුණ 　සලකනුවොත්
සිහි සඳහන් ඇතියො මැ 　වෙත්
පරම දුදන ගුණ 　මකුවොත්
කළ ගුණ සිහි නැතියො මැ 　වෙත්

නව ඉසුරෙන් 　ඉපිලෙනුවොත්
මුල සිහි නැති උඩඟුවො 　වෙත්
සිහි ඇති අය රජ 　පැමිණැත්
මුල තොරතුරු නිතර 　සිතත්

දිවි සටනින් ජය 　ගැනුමෙහි
පෙරදැරි මහ සෙබළෙකි 　සිහි
අතැවැසි දන 　හැසිරැවුමෙහි
සුපුහුණු රිය සැරියෙකි 　සිහි

මහ දන සිත් බැඳැ - 　ගැනුමෙහි
නොවරදනා මතුරෙකි 　සිහි
හැම වැඩ එ මැ එ මැ 　මොහොතෙහි
සලසන මෙහෙකරුවෙකි 　සිහි

එ බැවින් සිහි 　නොගිලිහෙන්න
නුවණින් මෙනෙහී 　කරන්න
ස ත තින් එය පුහුණු 　වන්න
සු ම ගින් සිය සිත 　බවන්න

— බෞඩ ළමය

දුහුන පබඳ

බම්බලපිටියේ
කාලිංග විජයවර්ධන

අහසේ යුද්දය

I

'අන්න අයියේ අහසේ පාට!' මෙ සේ කියේ මගේ නංගි ය. මමත් එළියට අවුත් අහස දිහා බැලුවෙමි. නංගී කියේ ඇත්ත යි.

'ඔව්, නංගි අද අහසත් තරහෙන් වාගෙයි.'

'කා එක්ක ද අයියේ තරහෙන් වාගේ?'

'මහ පොළොවත් එක්ක.'

'කොහොම ද දන්නෙ අයියා ඒ වග?'

'තව ටිකෙකින් පුපුරාවි; පටන් ගනිවි යුද්දෙත්.'

මට කියන්නට ලැබුණේ මෙ පමණ යි. විදිලියක් කෙටුවා එ විට ම. අපේ ඇස් තිලංකාර වුණා. නංගී මගේ ඇඟේ එල්ලුණා. එ විට ම ඇහුණා අහසේ ඉහළ මහ පිපිරිල්ලක්

'ඩොං පට පට පටාස් ගුඩු ගුඩු ගුඩු'

ඒක ද අයියේ අහස තරහෙන් කළ පිපිරිල්ල.'

'ඔව් නංගි.'

'කෝ ඉතින් යුද්දෙ?'

'දැන් පටන් ගනිවි.'

ඒ එක්ක ම අහසේ ඇහුණා, හෝ හෝ හෝ හඬ. ඒ කුණාටුවෙකි. පොල් ගස් පොළොවත් එක්ක අහස කරන්නට එන යුද්දේ සෙබළුන් වාගේ වැනිවැනි හරි-ගැහුණා.

අහස එවූ ඊතල වාගේ වැහි දරා එන්නට වුණා. ගියේ ටික වෙලාව යි. අපේ වත්තත් මිදුලත් එක ම වැවක් වාගේ පෙනුණා. පොල් ගස් නමැති යුද සෙබළුන් ගේ හැළුණු කඩු පත් වාගේ හැම අත කොළපු මට්ටු ආදිය! මැරී වැටුණු කැපී වැටුණු සෙබළුන් වාගේ ඉගිලී, කැඩීගිය ගස් ද තැනින් තැන පෙරළී තිබුණා.

අපේ තාත්තා ඒ බලා මෙ සේ කිවා.

'පුතා, අහසේ යුද්දය දැක්කා ද?'

II

හොඳ පාඩම

මිහිරිගම
වසන්ත කුමාර සේනානායක

ලේනා ජම්බු අත්ත දිගේ ආවා. මා ආවා ජම්බු ගහ මුලට. ලේනා අත්තෙන් පැන්නා අපේ වහලට. මා කෑ ගැහුවා අපේ ගෙදර මෙහෙකරු ළමයාට.

'පියදස, ඔය ඉණිමඟ ගෙනෙන්න'

පියදස ඉණිමග ගෙනායේ ය.

'ඉණිමඟ වහලට ගහන්න.'

පියදස ඉණිමඟ වහලට තැබුවේ ය.

'දැන් වහලට නැඟ අර ලේනා අල්ලා මට දෙන්න ඕනෑ.

'අපොයි මට බැහැ.'

''එහෙනම් මේ ඉණිමඟ අල්ලන්න. මම යන්නම් වහලට.''

පියදස ඉණිමඟ අල්ලාගෙන සිටිද්දී මම ඒ දිගේ වහලට ගියෙමි.

'කෝ, කෝ ලේනා? අන්න උං මුදුන් වහල දිගේ දුවනවා!'

'මම ද මුදුන් වහල දිගේ දුවන්නට වීමි.'

'අන්න මහත්තයා වහලේ'

පියදස ගේ මේ හඬින් එහි ආ අම්මා මට බහින්නට කීවා ය.

මෙ අතර ලේනා ද වහලේ අනෙක් කෙළවරෙන් කොස් ගහට පැන්නේ ය. බලාපොරොත්තු සුන් වූ මම ඉණිමඟ ගසා තුබූ තැනට ආවෙමි බහින අදහසින්.

මෙ අතරේ තාත්තා එහි ආවොත් වැඩේ හොඳ නැති වන බව සිතූ මම ඉක්මන් කොට ඉණිමහට පා තැබුවෙමි. ඇත්තට ම 'ඉක්මන් කොට' විය. ඉණිමහ ලිස්සා ගියේ ය. මම ඉණිමහ සමඟ ම ලිස්සා අවුත් වැටුණෙමි.

අම්මා කෑ ගසාගෙන එහි දිව අවුත් මා නැඟිටැවූවා ය. හොඳට ම රිදුණත් ඒ බව නො හඟවා මම නැඟී සිටියෙමි.

කෝ, කෝ ලේනා?

'උන්දෑට හොඳ පාඩම!' කියන්නාක් මෙන් කොස් ගහේ අත්තට බෙර ගසමින් නටන ලේනා මම දුටුවෙමි.

III

එළුවා ගේ පව

රත්මලානේ
කු. ම. විජේසූරිය

'ආයිබෝවන්, බැහැහැ, බෑ!'

මම පුදුම වී බැලුවෙමි. ඒ එළුවෙකි. එළුවන් මිනිසුන් වාගේ කතා කරනවා ද?

'ඔව්, මා දන් එළුවකු වුණාට ගිය ආත්මෙ ඔබ වාගේ ම ළමයකු ව උන්නා.'

'ඉතින්, ඉතින්?'

'ඒ කාලේ අම්මා හැම දා ම මට කරදර කළා පාසල් යන්න. මා ඒ හැම දා ම කීයේ බෑ බෑ කියා යි.

තාත්තා ඔහුට උදව් කරන්නට ය යි මට කීවා; මා කීයේ බෑ බෑ කියා යි.

මගේ යහළුවන් මට නොයෙක් වැඩ කීවා. ඒ ඔක්කෝට ම මා කීවෙ 'බෑ බෑ, බෑ' අහල පහල මිනිසුන් නොයෙක් වැඩ මට කියා තියෙනවා. ඒ හැමට මත් මගෙන් ලැබුණු පිළිතුර නම් 'බෑ, බෑ, බෑ, බෑ.'

හැබැයි මා බෑ නො කීයේ එක ම එක වැඩේට යි.

'ඒ කිමෙක් ද?'

'කෑමට! කෑමට!'

'ඉතින් ඔන්න ඔය පවින් මා මැරී එළුවකු වුණා. දැනුත් කොයි එකටත් මා කියන්නේ බෑ, බෑ, බෑ තමයි.'

මෙ සේ එළුවා ඔහු ගේ කතන්දරය මට කියා දුන්නේ ය.

IV

මී මැසි මිතුර

පහළ කීඹියේ
(**A.**) පොන්නම්පෙරුම

දිනිසුරු උදේ සිය තෙද පතුරුවන විට
පිබිදී දවසෙ වැඩ කටයුතු කිරීමට
ගී ගය-ගයා ඔබ එනු දැක නැඟී සිට
මල් කුමරිය සැදෙයි ඔබ පිළිගැනීමට

මල් කුමරිය ගෙ සුදු සුනිමල් මුව මීයේ
ඇල්මෙන් හැපී 'මදි නොකියන්නට ආයේ'
රොන් රස උරන සැටි ඔබ නැළැවී ගීයේ
පින් බර දැකීමෙකි නොනිමෙන නවතායේ

සියපත් සෙව්වන්දි ඈ මිතුරියන් ගත
නො මැ දී දුකක් පිනවා උන් හැම ගෙ සිත
දැහැමින් දිවි ගෙවන මගෙ බිහු කලණ මිත
දෙනි හොඳ ගුරු කමක් ඔබ මනු සතා වෙත

පසඳුව

1. ආර්‍ය ද? ආයර්‍ය ද?

– (M. A.) ආර්‍යසේන

මාතර තුළේ දී යැ.

[ආර්‍ය යනු යැ නිවැරැදි. මෙ යැ හේතු:–

(1) ආර්‍ය යන්නෙහි හැඬැවීම (උච්චාරණය) ආර්ය යනු යැ. එහෙත් ආයර්‍ය යැ යි යමකු ලියතොත් එහි හැඬැවීම 'ආර්යය' මිසැ 'ආර්ය' යනු නො වෙයි. ඒ නියරින් 'සූයර්‍යයා' යනු සූර්යයයා මියැ සූර්යයා නො වේ.

(2) සකු සන්දි නියරින් වුව ද වැඩි යංසය ඉඩ නොලබන්නෙකි.

නිද:- පරි + අන්ත = පර්යන්ත (පර්‍යන්ත)
ගිරි + ඊශ = ගිර්යේශ (ගිර්‍යේශ)
පරි + අවසාන = පර්යවසාන (පර්‍යවසාන)

එ හෙයින් මේ පද පයර්‍යන්ත, ගියෙර්‍යශ ඈ විසින් ලියනු වැරැදි වෙයි.

(3) අලුතින් පැහැරැවුණු සකු පොත්හි – වෙසෙසින් වදන් කොසුවලැ ද ආර්‍ය, සූර්‍ය, වීර්‍ය ඈ මිසැ ආයර්‍ය, සූයර්‍ය, වීයර්‍ය ඈ නො ලැබේ.

—සකසු]

2. Strategically despise the enemy, but tactically take him seriously.

මෙයට මුසු බසින් මා දී ඇති පෙරළිය මෙ වෙයි.

'මාර්මික ව සතුරා තුච්ඡ කරනු. එහෙත් ඖපක්‍රමික ව බැරැරුම් ව ගනු'

සටනෙහි දී ගැනෙන Strategy Tactics යන දෙ වදනට නිසි හෙළ වදන් අපට නො වූවා විය යුතු. මේ සඳහා නව හෙළ වදන් දෙකක් තනන්න.

දේශබන්ධු.

මහනුවර.

[හිතවත් දේශබන්ධුනි, මාඕසේතුං වැනි වියතුන් ගේ මේ නියාවන් නොදත් නමුත් අපේ කැලෑ බද ගැමියන් අතර වන සතුන් දඩයමෙහි දී යෙදෙන වදනෙක් වෙයි. එ නම් උපමාරු යන්න යි. 'හරියට උපමාරු බලා උගුල අටවන්න' යනු ඔවුන් අතර කියැවේ.

උපමාරු යනු උපාත් මරුත් යන අරුත් ඇති උපා + මරු යන දෙ වදනේ සරු (ස්වර) මාරුයෙන් වූවෙකි. මෙහි උපා නමින් ගැනුණේ ඉංගිරිසි Tactics යනුයෙන් ගැනුණු අරුත යි. මරු නමින් ගැනුණේ ඉංගිරිසි Strategy' යනුයෙන් ගැනුණු අරුත යි.

එ හෙයින් ඉංගිරිසි කියමන හෙළ බසින් මෙ සේ ගනිමු ද?

'මරු විසින් සතුරා හෙළා දකිනු. එහෙත් උපා විසින් බැරැරුම් වැ ගනු'

— සකසු.

3. පහතැ සඳහන් වදන් සඳහා සුදුසු හෙළ වදන් දක්වන්නැ.

සුදත් වීරකෝන්

උණවටුන

[ඔබේ වදන් හා මැ අප සලකවන වදන් දැක්වෙයි.

— සකසු.

Idiotic amazement – මෝඩ විස්මය

Plum – පලුම්; පලම
පල මැ පලම් යැ. වය මැ වයම් ඉඩ මැ ඉඩම් ඈ නියරිනි.

Apron – පෙර - වැස්ම

Repatriation – මා බිම පිළිපැමිණුම, සිය රට පැමිණුම.

Repatriate – මා බිම් පිළිපැමිණේ.

Confession – විපවසුව (වි + පවසුව)
මෙහි වි, වෙසෙසි අරුත්හි උපසග යි.

Confess - විපවසයි.

Consul - කොන්සල

Sofa - සෝපාව; සුවපාව

Mystic Soul - විසැඟි අත්ම [වෙසෙසින් සැඟි-විසැඟි] අත් මැ අත්ම (සකු - ආත්ම) යි.

Universe - සක්වළ

Shooting Star - උල්කා

Group of astronomers - තරු - විදුදත් (විද්දත්) මඬුල්ල තරුවිදු මඬුල්ල.

Astronomy - තරු - විදුව

Astronomer - තරු - විදුවා

Relaxation - ඉසිඹු - ලැම; ඉස්බුම

Relax - ඉසිඹු - ලයි, ඉස්බෙයි.

Exhilaration - පමොදුව, පමොදනය

Refugee - රකුම් - යැදි

Advance - පෙරවු මිල

Communism - සමනියාව [සම බව ඇත්තේ සම + අනි = සමනි]

Communist - සමනියානු [සමනියා + අනු]

Lattice - දඬු දැල්

ආයතාකාර - දිගටි

කාර්මික - කැමි, කම්හුරු

ආගමික - හදැහියනු, සමයනු

4. එඩිය බෙහෙවින් හුදු හෙළුවට මැ ඇරුණු සගනුවක් සැටි යැ. සකු ඈ වදනින් තොර වැ මෙ සේ හුදු හෙළුවට මැ අප නැමීමේ අදහස කිම?

දෙව්නුවර, ක. රූපසිංහ

[මෙ පැනය මෙයට පළමු ද සුබසින් නැඟුණු අයුරුත් එයට එහි පිළිතුරු සැපැයුණු අයුරුත් අපට මතක යි. ඔබ ගේ දැනීම සඳහා සුබසින් ඉපිටුණු ඒ පැනත් සිළිතුරුත් පහතැ දක්වෙයි. —සකසු.]

i. පැනය :

'දැන් දැන් ඔබ හුදු හෙළු සද මැ වහරවනි. එහි ලා එක් පැනයක් නහමි මම. මා පහදන්නැ.

එ ද ඔබ ඔබ ගේ ප්‍රබන්ධොපදෙශයෙහි දක්වූ කයොර රීතියට ඉතින් කවර දෙවියන් ගේ සරණ ද? 'පුවක් ගස්' යැ යි නො කියා 'පූග වෘක්ෂ' යැ යි කියුවෝ, 'එල් වැල්' යැ යි නො කියා 'ඒලා ලතා' යැ යි කියුවෝ, 'සඳුන්' යැ යි නො කියා 'චන්‍දන' යැ යි කියුවෝ, 'බුලත් වැලින්' යැ යි නො කියා 'තම්බූල වල්ලියෙන්' යැ යි කියුවෝ, ඒ ඔබ මැ නො වෙත් ද? ඉතින් දැන්?

එ ද සිංහල සිංහාසනය ගැනැ උදන් අනද්දී, ක්‍රිස්තු ජන්මෝත්සවය ගැනැ ප්‍රීත වද්දී, ඔබ ගේ පැන් තුඩ, ගෙරුවියැ යුතු තන්හි දී ගෙරුවූයේ, ගැයියැ යුතු තන්හි දී ගැයූයේ, හැඬියැ යුතු තන්හි දී හැඬූයේ, තව සියයකුත් එකක් මෙ වැනි විසිතුරු පැයේ සකු සද ද මුසු කොටැ ගත් හෙයිනැ යි මට සිතෙයි.

තව ද කිව යුත්තෙකි. රසයුවාට වනාහි අගාධ වූ අපාර වූ ශබ්ද සාගරයක් මැ වියැ යුතු යි. ඔබ දැන් කරන සැටියෙන් අපේ සද කොසුවට ද පහරක් නො වදී ද?

—භියුබත් දිසානායක

පිළිතුර :

[අපේ මැ වදනින් දිව රු අඳින්නට බැරි නම් නො, අප අනුන් ගෙන් හිභාගත් දය මැ ඉදිරියට පැමිණැවියැ යුතු? ගයන්නට හඬන්-නට පමණක් නො වැ ගොරවන්නට දෙදර-වන්නට වුව ද අප ගේ වදන් පමණි. බැරි කලැ, නොදත් කලැ, කළ දැයින්, පිළිවන් කලැ, දත් කලැ, කරන දෑ නො මිනුව මැනැවි.

—කුමරතුඟු මුනිදස්]

(සුබස 2 වෙළුම 17 කලබ; 1941. 1. 13)

ii පැනය :

'සුබසේ 17 කලබෙහි, 'හුදු හෙළුව' නමින් මා නැඟූ පැනයට ඔබ දුන් පිළිතුරින් මගේ සිත නො නැළැවිණි. එ හෙයිනි යළි ඉති පිය තබනුයේ.

මට පිළිතුරු දෙන ඔබ මෙ සේ කියති. 'ගයන්නට හඬන්නට පමණක් නො වැ ගොරවන්නට දෙදරවන්නට වුව ද අප ගේ වදන් පමණි.' මම නම් හෙළ බස් සයුරේ එ ගොඩ මෙ ගොඩ පිනා බැලුවෙක් නො වෙමි. එහෙත් මට නම් මේ හැදූහියැ නො හැකි යි. මෙන්න මම ඔබ ගේ මැ රැසැ-යුමක් ඇඳූ දෙමි. ඒ එ සේ ම පණවත් වැ ඔබ කියන ඔය හුදු හෙළුයෙන් පැවැසුව මැනැවි.

''සුන්‍දරිය, මෙහි බලව, මේ පාණ්ඩ්‍ය රාජයා යැ. උභයාංශයෙහි අර්පිත වූ මුක්තා-හාර ඇත්තේ යැ. හරිචන්‍දනයෙන් කරන ලද අඞ්ගරාග ඇත්තේ යැ. එ හෙයින් තරුණ රවි කිරණයෙන් රක්ත වර්ණ වූ කූට ඇති ගලන නිර්ඣර ධාරා ඇති පර්වත රාජයක්හු මෙන් බබළයි. ලංකාධිපති රාවණයා ද ඉන්‍ද්‍ර ලෝකය ජය ගන්නා පිණිසැ ගියේ මොහු හා සමඟ යැ. තාම්බූල වල්ලියෙන් පරිනද්ධ වූ පූග වෘක්ෂයන් ඇති ඒලා ලතායෙන් ආලිංගිත වූ චන්‍දන වෘක්ෂයන් ඇති තමාල පත්‍රමය ආස්තරණ ඇති මලය ස්ථලයන්හි ක්‍රීඩා කිරීමට පහදුව. මේ රාජයා ගේ ශරීරය ඉන්දීවර ශ්‍යාම යැ. ඔබ ගේ ශරීරය ගෝරෝචනා ගෞර යැ. විද්‍යුල්ලතා මේඝ කූට දෙ දෙනා ගේ මෙන් අන්‍යොන්‍ය ශොභා පරිවර්ධනය පිණිසැ ඔබ දෙ දෙනා ගේ සංයෝගය වේ වා!''

(ප්‍රබන්ධොපදේශය 73 පිට)

තව ද සකසුවෙනි, ඔබ මෙ සේ ද කියති. 'බැරි කලැ නොදත් කලැ කළ දූයින්, පිළිවන් කලැ දත් කලැ කරන දැ නො මිනුව මැනැවි.' මම පැනයක් නඟමි. මේ ඔබ කියන්, දෙ කල වෙන් වන ඉර කො තැනැ ද? මේ නොබෝ ද ඔබ කළ ගෛගර විවේචනය බලන්නැ. ඒත් නොදත් කලැ ද?

මගේ දිළිඳු අදහසේ හැටියට නම් සකු සද මුළුමනින් මැ වැරීම හෙළුවට ලක් කරන පහරෙකි. හෙළ රසයුවාට රිසි සේ හැසිරෙන්-නට ඇති සද පිටිය ඇව්රීමෙකි. හෙළුවට බර වීම යැ කළ යුත්තේ.

—හියුබත් දිසානායක

පිළිතුර :

[නො රැවැටුණ මැනැවි. මිනිස් දුබුල් බැවින් කලක් පුරුදු වූ දූයෙහි නැති නැබළ බල බැලීමට දහස් නුවන් ලබති මිනිස්සු. අමුතු වැ පැමිණි දෙයෙකැ නම්, ඇති බලය පවා දක්මට ඔවුන් ගේ එක ද ඇසෙක් නො ඇයේ.

අර ඇඳූ දක්වූ පබඳ පෙදෙස උදෙසා අප හපන් කම් නො වැනුව මැනැවි. කාලිදසුන් ගේ හපන් කමෙකි ඉන් පළ වනුයේ. බලන්නැ ඒ අරුත මැ හෙළුයෙන් පළ වූ කලැ සැටි:-

'යහදසන, නුවන් පිනවන්නැ. එඩි නොමැඩි පඩි රජ යැ මේ. දළන දළ මුත් හරින් දළැවෙන දැළ යැ. රිහිරි හරි හරි-සඳුන් මිහිර අහරවන අහරා ගත් ඇඟ යැ. එ හෙයින් තුරුණු රිවි කිරණ පැතුරුණු කුළින් දෙ පසැ හැලිහැලී දිළි අලි හැළි බැබැළි පළ පුවළ ගිරි රජක්හු මෙන් වොරජයි. ලකිසුරු දසගිරසා ද දුරු ඉඳුරු මැඳුරු දදුරු කරනු සඳහා මෙ රජ සඳ හා සඳහා යැ ගියේ. නිමල තමලු දල ඇතිරිලි පැතිරිලි ඇති මලය තලයෙහි, බුලත් ලිය පුවක් තුරු වලඳී, එල් ලිය සඳුන් තුරු වලඳී. තෙල හෙම් ලිය අර ඉඳු නිල් මිණි තුර නො වලඳී ද? මොහු සිරුර ඉඳුවර බඳු අඳුරු යැ. ඔබ සිරුර ගොරොද අරදවන ගොර යැ, මේ කුළෙහි විදු ලිය මෙන් මේ කළුයෙහි ලෙළ දී උතුන් පැහැ පහන්නැ.''

අනෙකක්හු ගේ බැඳුමක් අනුවැ ගිය හෙයිනි මඳ බුරුලක් වත් හොත්. ' අර මුල් පබඳ පෙදෙස තරම් නොහොබනේ යැ යි කියන්නට මැ ඔබ සිත් නැමෙනු වියැ හැකි. ඒ මිනිසි සබාව යි. කුම් කෙරෙමු ද?

බෙහෙදක් දෙනුයේ ලෙඩකට යැ. කෙළි පිණිසැ, රස පිණිසැ, නො වේ. එ හෙයින් ගයිගර වියරණ විවිසුව මෙ තන්හි ලෙඩ නොලෙඩ කාටත් සරිලන පිළියමක් නො කළ යුතු.

සකු වදන් මුළුමනින් මැ වැරීම හෙළුවට ලක් කරන පහරෙක් නො වේ. දුඹුල් කලෙකැ කුලී සෙනඟක් යෙදුව ද, බල වැඩුණු කල්හි කවරෙක් නම් එ බන්දකට ඉඩ දේ ද? කුලී සෙනඟ සමඟ මැ සටන් කැරැ පුරුදු වූවකු මඳකට මීමිනුමක් කරනු වියැ හැකි. මෙ නොවේ එ සිතා සියල්ලන් විසින් ගණනට ගත යුත්තෙක්.

—කුමරතුඟු මුනිදස්

(සුබස 2 වෙළුම 19 කලඹ; 1941. 2. 19)

* * *

පාණ්ඩ්‍යෝ'යමං'සාර්පිත ලම්බ හාරඃ
ක්ලිප්තා'ංගරාගෝ හරිචන්දනේන
ආභාති බාලා'තප රක්ත සානුඃ
සනිර්ඣරෝ'ද්ගාර ඉවා'ද්‍රි රාජඃ

තාම්බූල වල්ලී පරිනද්ධ පූගාස්-
'වේලා ලතා'ලිංගිත චන්දනාසු
තමාල පත්‍රාස්තරණාසු රන්තුං
ප්‍රසීද ශශ්වන් මලය ස්ථලීෂු

ඉන්දීවර ශ්‍යාම තනුර්නෘපෝ'සෞ
ත්වං රෝචනා ගෞර ශරීර යෂ්ටිඃ
අන්‍යෝ'න්‍ය ශොභා පරිවෘද්ධයේ වාං
යොගස්තඩිත්තෝයදයෝ'රිවා'ස්තු.'

[මෙ වෙයි නිරින්ද පඬි, මුත් හරින් යුත්
දැලෙළ් ලඹන්නා, අඟරා සඳුන් ගත්
දුල් වෙ මුදුන් ළා හිරු රස් වැදී රත්
ක්‍ෂන්දෙ'ව හැළෙන්නා හැලි යුත් දෙ පැත්තේ

පුවක් තුරින් යුත් වැළ-ලූ බුලත් වැල්
නඳුන් සඳුන් එල් ලිය හා වෙළුම් ගත්
තමල් දලින් ලූ ඇතිරිල්ල මත්තේ
රැමුම්හි තුස් වන් මල ගල් තලායේ

සම වන් බඳ යි මෙ රජු නිල් උපුල් වන්
සේ පැ රැපැ බඳ ඔබෙ ගොරදෙ'ව දැකුම් කල්
දෙන්නා ගෙ පැ පැදිලි වි දිළුම් වස්
මෙ, මෙ කුළේ විදිලියෙ'ව ලෙළ දි බලත් වා!]

(රඝු වංශය)

කුරුලු විරුව

සිරි දේවනාරායන

පෙමින් සොහොවුරු සටන් බිම් වැද
විහඟ ලොව සිය නම තියා
අහිංසක පොඩි කුරුලු පැටවකු
කවුඩු පහරින් මිය ගියා

රුදුරු කවුඩකු කළ විනෝ
නොහැකි වාවනු දෙව්දුනෝ
අහිංසක සියොතුනු අනේ
තව මැ වැලැපෙති මහ වෙනේ

කුරුලු පැටැවෙක් අඹ ගසේ
බොජුන් වැළැඳී නිදහසේ
රුදුරු එක් කවුඩකු ඇසේ
වැටිණි ඒ රුව නිසි ලෙසේ

පවනට බඳු වෙයින්
ආ යැ හේ එහි පිය'ඹා
බිය වූ කුරුලු පැටවා
මර හඬ නඟන්නට වී

ඇසූ දුටුවන් හැම
කම්පා කරන විලසින්
අසරණ පැටවු දෙ දෙනා
වෙයින් මහ හඬ නැඟුවෝ

දයාවක් නොමැති ඒ කවුඩුවා ගේ
හද උණු කරනු නොසමත් වියැ එ වේගේ
වැලැපුම හැඬුම හැම අසරණ එකා ගේ
මහත් විනොයුවෙකි අද බලවතා ගේ

එක් කුරුලු පැටැවකු
තුඩින් ගත් රුදු කවුඩා
හීයෙකැ වෙයින් පියඹා
ගියේ, අනෙකා තනි කොටැ

සොහොවුරා හඬවා
ගෙනැයන රුදුරුවා දෙසැ
බලාසිටි අනෙකා මහ
හඬක් දී යටි ගිරියෙන් -

හේළි විරුවකු ලෙසැ
සතුරා හඹාගෙනැ ගොස්
පිටැ පිටැ හොටින් පිටැ පිටැ
මරු පහර දෙන්නට වී.

උගේ බලේ උගේ තරම කිසිත්
නොදත් ලෙසක් රූපැ මහත් වෙයින්
ඒ වීර වූ සියොත් පුතා උගේ
තුඩින් කෙටී රකුස් වෙසක් රූපැ

අසරණ කුරුලු පැටවා මරු වෙසින් සිට
පිටැ පිටැ කෙටූ පහරින් රිදුණෙන් තදට
වැළැඳුම කුරුලු කුණ මොහොතක්
නතර කොට
කවුඩා හැරිණි විරුවා හට කොටන්නට

තියුණු කවුඩු හොටින් වැදුණු
පහර දරාගත නොහැකි වැ
සිහිති කුරුලු පැටවා ඇදැ
වැටිණි බිමට ලෙයින් රතු වැ

මේ දුක් මුසු විපත
දරා - ගත නොහැකි වැ දෝ
වන දෙව් හඬන විලසින්
වැහි පොද වැටෙන්නට වී.

පෙමින් සොහොවුරු දිවි පියයි
විහඟ ලොවැ සිය නාමා තියා
කුරුලු සුර පුර තතු සොයා
කුරුලු පැටවකු මිය ගියා

නොසැබි පතපොත

ද. දූ. න. වීරකෝන්

එක් දෙසකට රැසකට සැබි දෙය තවත් දෙසකට රැසකට නොසැබි වියැ හැකි. එහෙත් සියල්ල මැ නො වේ. හොර කම, බොරු කීම ඈ වැනි දේ ලොවේ කවර දෙසෙකැ රැසෙකැ වුව ද පිළිකුල් කෙරේ. වෙනසක් පෙනෙනුයේ ඇතැම් සිරිත් විරිත් අතර යැ. ඔවුනොවුන් ගේ දෙසට රැසට හිමි වූ සිරිත් විරිත් උලඟින්නෝ ඒ දෙසේ ඒ රැසේ පිළිකුලට බඳුන් වෙති.

මෙ වැනි පිරිසෙක් අප රටේ ද වෙති. ඔහු රැසේ හැදියාව, සැබියාව කෙරේ කුදු හෝ හැඟුමක් නැති වැ අවර දිගුවන් ගේ ඉතා පහත් පෙළේ සිරිත් විරිත් අප ගේ රටේ ද බෝ කරමින් බඩ වඩාගැන්මේ දීන වියපුරුවෙකැ යෙදී සිටිති. ඔවුන් මේ කරනුයේ ඒ අදහස් ලියා, පැහැයුණු පතපොත මඟිනි. අපේ සිරිතට, විරිතට, හැදියාවට, සැබියාවට විරුදු වැ ඒ නසනු වනසනු වස් ලියා පළ කරවන කවර පොතක් වුව ද අපි නොසැබි ගණයෙහි ලා සලකමු. අප එ සේ නොසැබි ගණයෙහි ලා සැලැකැවූ පොත්හි බෙහෙවින් මැ සඳහන් ලබනුයේ කිමෙක් ද? තුරුණු හදවත් නුරායෙන් කලඹවා, උන් මත් මත් කරවන ඉතා පහත් අදහස් යැ. දරුවකු නාන සිය මව ගේ නාන කඩින් ඇගේ වසන් තැන් දක්නට තැත් කළ සැටිත්, නිදි යහනට වන් ඒ දරුවා ඒ පිළිබඳ සිතිවිලි වැඩූ සැටිත් විසිතුරු වන ගතෙක් අද අප රටේ පාසල් දරුවන් අතැ පැටැවෙයි. මෙ වැනි පහත් හැඟීමෙන් කැලැඹී ගිය සිත් ඇති දරුවන් මතු කලැ කෙ අයුරු වෙත් ද? ඔහු ගෙන් රටට වන වැඩ ගැනැ කතා කුමට යැ?

මේ පොතේ මැ තවත් තැනෙකැ, එක් පට දරුවකු වෙසඟනක හා බැඳී, රැයක් ගත කළ සැටි ඉතා මැ පහත් බසින් විසිතුරු වෙයි. ඒ වැකි පෙදෙස මෙහි ලා සඳහන් කොටැ, 'එඩිය' වැනි වැදගත් සඟනුවක් කිළිටි කරන්නට අපි බමිහ. මේ ගත් කරුවා එ වැනි විසිතුරක් කෙළේ ඇයි? හේ තුරුණු සිත් හසර මැනැවින් දනියි. තුරුණුවෝ නුරායෙහි වහා ඇලෙති. ඒ සොබා යැ. එ වැනි දැ සඳහන් පත පොත කියැවීමට රිසිය හ ඔහු. මුදල් ඉපැයීමට නම්, තුරුණු හද නුරායෙන් ඇවිස්සෙන සේ, පත පොත මැ තමා ලිවීම කළ යුතු. මෙ වැනි පත පොත කියවා ඇවිස්සුණු කොළොඹැ විදු හල්හි ඇතැම් සිසුවන් ගණිකා මඩම් සොයා යෙති යි අනඳ විදු හල් පති තුමෝ ගිය ද පළ කළහ. එහෙත් මෙ වැනි දැ, නව අන්දරයන් තිපැයීමේ දී ගැන්ම ඉතා සුදුසු යැ යි මහ ගත් කරුවකු කියන සැටි ද බැලුව මැනැවි.

'තම මවගේ සෙළු කඩෙහි තැනක් දැකීමෙන් ළමයකු තුළ හැඟීමක් ඇති වීම, තරුණයකු වෙසඟනක් කරා යැම, ඔහු වෙසඟනක කසාද බැඳ ගැනිම නව කතාවලට වස්තු විය යුතු ජීවන ප්‍රවෘත්ති වෙයි'' (උපන් ද සිට – 350 පිට) මේ අනුවැ පත පොත ලියා පළ කැරවුව හොත් කිමෙක් වේ ද? දීන ගත් කරුවන් ගේ බඩ වැඩේ. රට එ හැම පිටින් මැ නැසේ. 'සංස්කෘති අමාත්‍යාංශයේ සාහිත්‍ය මණ්ඩලය' කරවන්නන් මහදනා ගේ මුදලින් රුපියල් දහසක් දී මෙ පොත අගැයූ ල!

මේ පහළ පෙළේ නොසැබි පත පොත දරුවන් අතැ ලැගෙන්නේ කෙසේ දැයි විමසමු. පේරාදෙණි සරසවිය හා සබැඳි එක්තරා ගත් කරුවන් පිරිසක් විසින් ලියා පැහැයුණු නොසැබි පොත් රැසෙක් වෙයි. මේ පොත් ඒ සරසවිය අනුදැනැ තිබේ. සරසවියෙන් පැවැත්වෙන පිරික්සුම් සඳහා පැන පත් සැකැසීමේ දී මේ පොත් ඇසුරින් පැන සැකැසේ. පිරික්සුම් හඳහා සැරසෙන හදරුවෝ ඒ කියවති. එහි එන අමු මැ අමු කුණු හරුප කියවන ඔවුන් ගේ සැහැවුණු

කැමි හැඟුම ලියලයි. ඉන් මන් මත් වන ඔහු ඒ දීන හැඟුම් කම්පසට පමුණුවන්නට මං සොයති. ඒ පිණිසැ ඇරුණු සුදුසු බිමෙකි, පේරාදෙණි සරසවිය. නන් වර පේරාදෙණිය පැත්තෙන් ඇසෙන නොයෙක් දැ එ බව පසක් කරවයි.

ලොවේ නොසැබි දැ සිදු වේ නම්, ඒ ලිවීම නොමැනැවි යි කියන්නේ කෙ සේ දූ යි නොසැබි පොත් ලියන්නෝ අසති. ඇතැම් විටැ නොසැබි දේ පවා පොත්වලැ සඳහන් කරන්නට සිදු වෙයි. හැදූණු උගතුන් ඒ කරනුයේ සැබියාව රකිමිනි. අපි හැරෙමු වහරට. පුම, ඉතිරි බව වෙසෙසා හැඳින්වෙන වදන් රුසෙක් වෙයි. නොහැදූණු දනන් ඒ පිණිස වහරන වදන් හැදූණෝ පිළිකුල් කරති. කෙනකු එසේ දෙඩනු ඇසුණොත්, හැදූණෝ 'උං කුණු හරුප කියති' යි පලවති. සැබැවින් මැ ඒ වදනින් ද හැඳින්වෙන්නේ එක් මැ දූය යි. ඇයි එහි වෙනස? සැබි නොසැබි බෙයක් ඇති හෙයිනි. තව ද නිදසුනක් ගෙනැ පාම්හ. කැම මැස්සකට අමු ගව මස් කැබැල්ලක් ගෙනැ තැබුව හොත් සියල්ලෝ මැ කෑම මැස්ස පියා යෙති. එහෙත් ඒ මස් කැබැල්ල රසට උයා තැබුව හොත් මස් කන්නෝ සොම්නසින් බුදිති. නොසැබි දූය වුව සැබි බව රක්මින් ඉදිරිපත් කළ හැකි බවට මෙ ද නිදසුනෙකි. මෙ බව නොදත් නිවට ගත් කරුවෝ නොසැබි දැ නොසැබි බසින් ලියා පළ කොටැ රට මැ වනසති.

පැරැණි පත් පොත්හි සඳහන් නොසැබි දැ කෙරේ හඩ නොනඟන්නේ ඇයි දූ යි මොවුන් නඟන තවත් පැනයෙකි. පැරැණි පොත්හි නොසැබි දැ නො වෙති යි අපි නොකියමු. එහෙත් ඒ සියල්ල සඳහන් කොටැ ඇත්තේ සැබි බව රකිමිනි. කව් සිළුමිණේ එන සුරා උලෙළ, කව් සේකරයේ එන බමුණු ඔවය, ඈ තන් කියවා වරදට නැමුණෝ කවරහු ද? ඒ තන් නොසැබි යැ යි පලවන්නට සැදූණෝ වෙති ද? පැරැණි පොත්හි එන එ බඳු තන් කියවා වටහාගන්නට පිළිවන් වනුයේ පැසුණු නුවණක් ඇතියනට පමණෙකි: ඉන් ඔහු නොමහට නො වැටෙති. වැසි අරුතින්, රස බසින් ඒ රසයා ඇති සැටි කෙ තරම් මැනැවි ද? මේ නොසැබි පොත් කරුවන් ගේ පොතුක් එසේ මැ ද? මොහු පැරැණි පොත් මුවායෙන් රැකුම පාන්නට සැරසෙති.

නොසැබි පතපොත පාසල් දරුවන් අතැ රඳවන්නට උඟල් අදිනා පේරාදෙණි සරසවි පිරික්සුම් සඳහා පොත් නිල කරන්නෝ දූයේ සද හැවිල්ලට සුදුස්සෝ යැ.

හෙළ දෙසට, රැසට, බසට, ඇදූහියට හිතැති හෙළයෝ වහා එක් වැ මේ බඩ වඩු දීන වියපුරුවට විරුදු වැ නැඟී සිටිත් වා!

* * *

"අශිෂ්ටයන් බහුල වීම ශිෂ්ටයනුදු ඒ ගණයට මැ
වැටියැ යුතු බවක් හඟවා ද?"

— පරෙවි සන්දෙශ විවරණය

පැදි විචිසුව

ත්‍රිවන්සිරි ජයතුරු

දෙදූවු විබෙදූව සඳහා නියම වී ඇති කව පෙළවල් අතුරින් අප සිත් ගත් තව එකෙකි "මිය ගිය දරුවෙක්". ඒ ලියැවී ඇත්තේ මීමන ප්‍රේමතිලක කිවියා විසිනි.

කවපෙළෙන් දක්වෙන්නේ ඉතා සෝ කුරු කතා පුවතෙකි. "සමන් සුමිත්" නැමැති දරුවා මළවුන් අතර යැ. සබා දහම ද මේ දූකැ මඳක් වෙනැසුණු සේ යි. දරුවා ජීවතුන් අතර සිටින කලැ සැම ගේ සිත් ගත් අයුරු දක්වන කිවියා ඉන් පසු කියවන්නා ගේ සිත යොමන්නේ සබා දමේ ඇසිරිමත් දහම් නයකට යැ. එ නම් ඔහු දිවියේ සිටියැ දී ඔහු ගේ මැ ලේ පොළෝ පස යටැ දිරමින් පැවැතුණු බව යි. තමා ගේ ලෙය ද දිරා යැමට වැඩි කල් නොයන බව මේ කිය වන්නා නිතැතින් මැ සිතනු නිසැකි. ඇතැම් විටැ මෙ බඳු කතා පුවත් දක්වීමෙ දී එය කියවන්නට නොහැකි තරම් නී රස වීම සමහර කිවියන් අතින් නොදැනුවත් වැ මැ සිදු වන්නේ යි. එහෙත් මෙ කිවියා ඔහු ගේ කතා පුවත සිත් ගන්නා–සුලු විදියෙකින් ඉදිරිපත් කොටැ ඇත්තේ යැ.

"සමන් පොහොට්ටුවක් බිමයි පිපෙන්නටත් කලින්" මෙ සේ යැ කව් පෙළ ඇරඹෙනුයේ. සමන් පොහොට්ටුව පිපුණා නම් ලොවට කො තරම් අගී ද? එහෙත් ඒ නො වීණි. මුළු කව් පෙළෙහි මැ ගැප් වී ඇති කතා පුවත එක පදයෙකින් දක්වූ සැටි පැසැසුම් කටයුතු යැ. සමන් පොහොට්ටුව සේ මැ සමන් සුමිත් නැමැති කුඩා දරුවා ද ලොවට සිය දස් කම් පෑමට පෙර මළවුන් වෙතට ගියේ යැ.

"හඳත් වැසී තිබෙ වලාකුළින් නබෝ ගැබේ" සබා දහම ද වෙනස් වූ සේ යි. ඒ කිමැ? කුඩා දරුවකු මිනී වළේ නිදන නිසා යැ. එ තැනින් යැ නියම විසින් මැ කතා පුවත දක්වීම ඇරැඹුණේ. "දෙ මාපියන් තුරුල්ල ද පොළෝ පසින් වැසී" මෙහි කිවියා විසින් 'ද' යන්න යෙදුණේ දමා යන වදන සඳහා යි. 'ද' යනු පුළුස්සා යන අරුත මිස දමා යනු නො දේ.

"මොකක්ද මෙ කි යා ලොවේ කෙනෙක් නොදන්නහු
මහා සමුද්දරේ මැණික් ගලක් වගෙයි පුතා"

මෙහි කෙනෙක් නොදන්නහු යන්න ගැළැපෙන්නේ කුමක් හා දැ යි සැක සිතේ. සමුදුරේ ඇති මැණික් ගලකට දරුවා සමාන කැරුණු බව සිතාගත හැකි වුව ද ඉහත සඳහන් දෙ පදයේ සැබැඳියාව මදි යැ.

ලොවෙහි ඇති ඉසි, කෝ (ක්‍රෝධ) මන් (මාන) ඈ දෙස්වලට පහර දීමට කිවියා අමුතු මඟක් ගති. මේ මළා යැ යි කියන කුඩා දරුවා මෙ ලොව උපත ලබන්නට සග සිටැ ඇත්තේ මිනිස් ලොවට පැමිණීම යහපතක් සේ සිතා යැ. එහෙත් මෙහි රැඳීමට ඔහුට සිත් නො වී. ඒ කිමැ? මෙහි ඇති දෙස් දක්මෙනි.

දරුවා නැති දුක තවත් දුරට දැඩි කොටැ දක්වීමට කිවියා සබා දහමෙන් මැ නොයෙක් කරුණු උදව් කැරැගනී. කිවියාව මැනැවින් පිළිබිඹු වන තැනෙකි මේ.

"දිවා රැයේ ඉරයි හඳයි සොහොන් බිමත් සිඹී
පුතාගෙ රූපයෙන් බිඳක් අරන් කුසුම් පිපේ"

ඉර, හඳ දෙකෙහි රැස් පොළොව මත වැටීමෙනුදු කිවියාට අමුතු අරුතක් වැටැහුණු සේ යි. ඒ කුඩා දරුවා කෙරෙහි සෙනෙහෙන් ඔහු සැතැපුණු පොළොව සිඹින්නා බඳු යැ. මල් පිපිම කවර දත් සිදු වේ. එහෙත් මෙ ද පිපුණේ මිය ගිය දරුවා ගේ රුවෙන් බිඳක් ගෙනැ යැ. මෙයින් මේ දරුවා ගේ සියුමැලි බව ද මතක් වන්නේ යි. කුරුලු නද ද සැම කල්හි මැ පැතිරේ. එහෙත් මෙ ද එයින් ගැයුණේ සමන් සුමිත් නමැති කුඩා දරුවා ගේ ගුණ යැ. නො පැනේ ද මේ මළවුන් අතර සිටින්නේ සැම ගේ මැ අදර ලත් දරුවකු බව?

සමන් සුමිත් ගේ මරණයත් වනයේ පිපෙන මලෙකැ පර වීම හා සම යැ. වන මල ඒ වනයේ සිය සුවඳ පතුරුවා මැලැවේ. මේ කුඩා දරුවා ද ඔහු සිටි පරිසරය පමණක් සුවඳ ගන්වා මළේ යි. සෙසු ලෙවනට ඒ දැනැ-ගත නො හැකි වී.

"ගහක් ගලා ගියාලු වාලුකා තලේ වැදී
කුඩාගෙඩිත් වැටෙ අකල් නැසීමෙකින් ලොවේ"

ගහක් වාලුකා තලයේ ගැවීමෙන් ඇති වනුයේ ඒ බිමට සහනයෙකි. එ මෙන් මැ මෙ ලොව වාලුකා තලයක් ලෙස ද දරුවා ගහක් ලෙස ද සිතියැ නොහැකි ද? ඒ ගඟ වැදී ගියේ යි. දරුවා මෙහි රැඳුණේ ද මඳ කලෙකි.

සමන් සුමිත් හට කිමෙක් වී ද? හේ සොබා දමේ ගිමන් කල්හි ළා දළුවෙක් වී. ගිම කලැ ළා දළුව නසී. එ සේ මැ වී මේ දරුවාටත්. ඉක්බිති වැ කිවියාට මතක් වන්නේ මේ කුඩා දරුවා කෙරෙහි තිබෙන්නට ඇති ගුණ යැ. ඔහු ගේ කිවියාව, කලා කම, වීරු බව පිළිවෙළින් රහල් හිමි, කසුප්, ගැමුණු ආදීනට වැඩි වන්නට තුබුණු බව හේ සිතයි. නැති වූ යමෙකැ අගය් වැඩියෙන් පෙනීම ලෝ සිරිති

කලෙකැ මේ දරුවා සිය දෙමාපියන් තුරුල්ලේ නිද ගති. කුඩා වුව ද ඔහු සඳහා වියන් ඇඳෙක් වී. එහෙත් හෙතෙම බිමැ නිදන්නට සිතී යැ. ඒ කුමක් නිසා දැ යි කිවියා අසයි. පෙර සිටි සැටියේත් ඔහු මළ කල්හි තතුවත් මවා පැමෙන් කිවියා කියවන්නා ගේ හද සෝ සයුරේ ගිල්වයි.

සමන් සුමිත් නැතියෙන් ගෙදර ද පාළු යැ. එය කිවියා දක්වූයේ කෙසේ ද?

"ගොයම් කැපූ වෙලයි අමාවකේ අහස් කුසයි
ගහක් නොවූ රටයි මලක් නොදක්ක වූ ගසයි
වසන්ත රාජයා නොගත් සොබාවෙ සුන්දරියි
වගෙයි සමන් පුතා ගියෙන් මෙද මගේ ගෙයත්"

පාළුව දක්වීමට කිවියා තෝරා-ගත්තේ ඉතා පතළ දකුම් කිහිපයෙකි. ගොයම් කැපූ වෙල කවුරුත් දනිති. ඒ පාළු යැ. අමාවක් ද අහස ද, ගඟ නැති රට ද, මල් නො වූ ගස ද වසන්ත කාලයෙන් තොර සබා දහම ද එ සේ මැ යි. 'තෙරුවන් මැනැවින් රැකි ඔහුටත් ඔහු ගේ පියඹටත් තව ද තුනුරුවනක් වූ බවෙකි. (10 වැනි පදයේ අරුත බලන්නැ.) මෙ දෙ වැනි තෙරුවනින් එකෙක් නැති වී. ඒ සමන් සුමිත් යැ. පළමු දක්වූ තුනුරුවනේ තිර බවත් දෙවැන්නෙහි නොතිර බවත් මෙයින් නොහැඟේ ද?

සිදනෙහි එන කියමනෙකැ ඇත්තක් ද කිවියා දුටුවේ මේ දරුවා ඇසුරිනි. ඔහු ගේ නැති වීමෙන් ළය සැනැහිම නැසුණු හෙයිනි. අසල් වැසියන් ගේ ද සිත් තැවිණි. මේ අසල් වැසියෝ යැ යටැ දක්වූ සුවඳවත් වූ වන පෙදෙස. (11 පැදිය)

තව ද කියමනෙක් කිවි සිතට නැඟේ. එ නම් දෙවියනට පිය අය ඉක්මනින් මිනිසි ලොවින් තුරන් වන බව යැ. මෙයින් අපට පෙනෙන්නේ මොහු ගේ දිවිය කෙටි වුව ද එයින් නොයෙක් පැටුම් උගන්නට කිවියාට හැකි වූ බව යැ. හෙතෙම ඒ බව මතු එන පැදියෙන් දක්වයි.

"අ-ආ-ඇ-ඈ-ඉ-ඊ-උ-ඌ-එකයි-දෙකයි-තුනයි
කියන්නටත් කලින් පුතා ලොවින් මැරී ගියා
බලන්නැ මෙ මහා ම විස්මයෙක්ය ඒ වුණත්
පුතා ලොවෙ හැබැ පුවත් ලියූ පොතක් වුණා"

පුතා ගැනැ කරුණු කියත් කියත් මැ ඔහු දරුවා කෙරෙහි දක්වූ සෙනෙහස වැඩි වූ සේ යි. මා එසේ දකින්නේ ඊළඟට ඔහු දක් වූ කව් දෙ පෙදෙනි.

"හඳේ! මොකෝ කසුන් කැලුම් ඇඟිල්ලකින් නුඹේ
පොළෝ තලේ විදින්නතැත් කරන්නෙ දූන් මෙසේ"

පළමුවෙන් හඳ පොළොව සිඹින්නා සේ දුටු කිවියා දූන් දකින්නේ ඒ හඳ මැ දරුවාට අයහපතක් කරන්නට සැරසෙන සේ යැ. කිවියා ගේ දරු සෙනෙහස කො තරම් විසිතුරු ලෙස දක්වීණි ද ! පළමුවෙන් ඒ අයුරන් මැ දුටු හිරු ද කිවියා දූන් දකින්නේ පෙළන්නකු සේ යැ.

"අනේ! හිරේ! නුඹේ රැසත් තදයි, රලුයි, සැරයි.
පුතාට ඒ හුරුත් නොවේ සියුම් නිසා බොහෝ"

කිවියා ගේ හැඟුම මෙයින් මැනැවින් පිළිබිඹු වන අතර මැ දරුවා ගේ සියුමැලි බව ද දෙගුණ තෙගුණ වේ. ඒ තවත් වැඩි වෙ ඊ ළඟ පෙදෙන්.

"සැපක් තොලත් නමුත් අපෙන් කුඩා වියේ වුයෙන්
වසන්න කාලයේ මලක් වගෙයි සමන් පුතා"

තාරකාවෝ ද අහසෙහි පායත්. මල්හු ද බිමැ පිපෙත්. වෙන ද සේ මැ යි. එහෙත් අදහස වෙනසි. අහසත් පොළොවත් අතර තරගයෙකි. කුමට ද? දරුවා ගේ සිනාවෙහි නියම සැටිය දක්වීමට යැ. අප අවට ඇති සබා හුරු සිදු වීම අතුරෙන් අමුතු දැකුම් දකින මේ කවිය අප කිවියා ගේ කිවියාව තවත් දුරට විදහා පායි.

බොහෝ අය නො සිතන කරුණකට කිවියා අප සිත යොමයි. ඒ සබා දහමේ අමුතු දහම් නයකට යැ. තමා පණැත්තකු ලෙසින් සිටියැ දී තමා ගේ මැ ලේ පොළෝ තලය යට දිරයි. (17 පැදිය) කෙනකු ගේ සිතෙහි මරණය ගැනැ හැඟුම් ඇති කරවන සුලු කියමනෙකි. ගහෙන් මලත්, මලෙන් පලත්, පලෙන් ගහත් ඇති කරවන සබා දහමෙ සැටි එ සේ යැ! ඒ නිසා මැ යැ සමන් සුමිත් අද බිමැ නිදන්නේ.

සැනැසීමක් සොයන කිවියාට එක් කියම-නෙක් මතක් වේ. සවසට නැසෙන නෙළුම් මල උදයේ හිරු රැසින් යළි පිපෙන බව යැ (18 පැදිය). එ ලෙසී වත් වූවොත් කො තරම් මැනැවි ද යි කිවියාට සිතෙන්නට ඇති.

ගහෙක් කිවි ඇසට ලක් වෙයි. එයිනුදු ඔහු දුටුවේ සමන් සුමිත් යැ. තමනට සිසිල ලබා දුන් ගං දෙ බඩ ද නොමතක වූ සේ ගඟ ගලා යෙයි (19 පැදිය). දෙ මා පියන් හැර දරුවා ද එ සේ ගියේ යි.

අඹ, දඹ, දං, මොර ඈ ගස් යටැ ඉදී වැටුණු ගෙඩි දකීම සබා හුරු යැ. එ හෙත් එහි දු කිවියා අමුත්තක් දකී. එ නම්, මෙ ගස් පවා දරුවාට අයිති කොටස කිසිවකුට දෙන්නට අකැමැති වැ බිමැ හෙළූ බව යි. කො තරම් අගනා කියමනෙක් ද! (20 පැදිය).

ඉහතැ සඳහන් පැදි පෙළ කියවන කලැ අප සිතට නැඟෙනුයේ කරුණා රසය යි. දරුවා නැති සොවින් වැලැපෙන පියකු ගේ හැඟුම් මනා සේ පිළිබිඹු වී ඇති නිසා යැ ඒ. ඒ අතර මැ නුවණ රසයෙක් ද ඇති වේ. එ සේ වන්නේ අප විසින් ඉහතැ දක්වුණු ලෝ අනිස පානා කියමන් නිසා යැ.

පද පෙළ දෙස බලන කලැ බෙහෙවින් යෙදී ඇති සකු වචන අපට පැනේ. විසේස-යක්, සමුද්‍රේ සුගන්දයත්, අහිංසකත්වයෙන් නවීත්වයත්, පියම්බිකාව ඈ විසිනි. ඒ සඳහා සිහල පද ඇති නිසා ඒ යෙදුවා නම් වඩාත් මැනැවි. එහෙත් මේ සකු වදන් වුවද සිංහල ඌරුයෙන් ගෙනැ ලියැවුණු බව මඳ අස් වැසිල්ලෙකි. ඇතැම් විටැ මේ කව් පෙළ ලියැවුණු විරිතට මෙ වදන් කිවියාට රුකුලක් වුණා වියැ හැකි යැ.

"දෙමාපියන් තුරන් කෙරූ පුතෙක්
වලේ නිදයි"

"කෙරූ" යනු අවියත් පදයෙකි. 'කළ' යනු යැ නිවරද. "දෙමාපියන් ද ගියා" ඈ තන්හි එන 'ද' යනු වෙනුවට 'දමා' යනු සිටියේ නම් මැනැවි.

කවියෙහි අරුත් දක්වීමේ දී අප විසින් කියවන්නා ගේ සිත් යොමන ලද උපමා මේ කව් පෙළේ අදහස් ඔප් නංවයි. කිවියා තෝරා-ගෙනැ ඇති උපමා ඔහු ගේ අදහස් ඔප් නැංවීමට මිස කිවියාව හරඹ කිරීමට නො යෙදුණු බව මැනැවින් මැ පෙනෙන්නේ යි. පැරැණි කව් පිළිවෙළින් වෙනස් උපමා දක්වා ලමින් කියවන්නාට නිසි පැවුම් දීම සැබැඳි වැ කිවියා පැසැසුම් ලැබි යැ යුත්තේ යැ.

'**මොකෝ** සොබා දමේ පවා විසේසයක් ?' (1 පැදිය) මෙහි '**මොකෝ**' යනු ගැමි වහරි. කද සොවෙහි දී කිවියාට වුව ද ඇතැම් විටැ සිය වහර නොමතක වන්නට හැකි වුව ද මේ මොකෝ යනු කව් පෙළෙහි තෝරා ගැනුණු සෙසු පද පෙළ හා නොගැළැපෙන්නෙකි. 'කිමෙක් ද ලෝ දහම් පවා විසේසයක්' ඈ විසින් පහසුයෙන් සකසාගත හැකි තැනෙකි මේ.

'**මොකක්ද** මේ කියා ලොවේ කෙනෙක් නොදන්නාහු'– (2 පැදිය) මෙහි ද 'මොකක් ද' යනු 'කිමෙක් ද' යනුයෙන් සැකැසුණා නම් මැනැවි. 'කෙනෙක් නොදන්නාහු' යනු ද කිරියකරු පද සබඳ කෙලෙසන යෙදුමෙකි.

'මැරී ගියා ලෙවන් හටත් **නොදන්නවා**' (5 පැදිය). මෙහි නොදන්නවා යනු 'නො **දන්වා**' යි සිටියැ යුතු තැනි. '**නො දන්වමින්**' යැ යි ගැනුණා නම් විරිතට ද හානි නො වී මැ වියරණය ද රැකුණේ වෙයි.

සභා (සභ), පරද්දනා (පරද්දන) යන තන්හි නුවූවමනා ඇදි දුබුල් යෙදුම්. **රැකූ**, හැඳින්වූ, **කෙරූ, ඉපැද්දවූ** ආදිය ද කිවියා හට පැසැසුම් ගෙනැ එන යෙදුම් නො වේ. මේ ඉතා පහසුයෙන් සැකැසියැ හැකි තැන් යැ.

පරෙවියා

(සාම අස්න)

මෙ තෙක් සිංහලයෙහි ලියැවුණු දිගුතම අසුන් කව යි.

ලොවේ බලවතුන් වෙත සාම අස්නක් ගෙනැ ලොව වටා යන පරෙවියා ගේ ගමන් මඟෙහි හමු වන මහ බිම්, දිවයින්, මුහුදු, කතර, වන බිම්, රහ හල්, නළු දසුන් ඈ විසිතුරු වැනුමට ලක් වෙයි.

අරිසෙන් අහුබුදුවන් විසින් පැබැඳිණි.
ලියනගේ ජිනදසුන් ගේ පඟදුයෙන් යුතු යැ.

පැදි 501 යි. මිල රු. 5.00 යි.

කොළොඹ, නොරිස් වීදියේ

මැකලම් පොත් හල

නීතිය - 4

වරෙන්තුවක් නැති ව, කෙනකු අත් අඩංගුවට ගැනීම

.........දම්මිත්

නඩුවක් ඇරැඹුමෙහි දී මැ සැක කරුවා උසාවියට ඉදිරිපත් කළ හැකි බවක් පෙර කීමු. ඒ කෙසේ වියැ හැකි දැයි අපි දැන් සොයා බලමු.

සැක කරුවකු මෙ සේ අත් අඩංගුවට ගැනීමට මහෙස්ත්‍රාත්වරයකු ගෙන් වරෙන්තුවක් නුවුවමනා බව ඔබට හැඟී යනු ඇති. මේ ගැනැ අපරාධ විධාන සංග්‍රහයෙහි දක්වා ඇති පරිදි මහෙස්ත්‍රාත්වරයකු ගේ නියමයක් නැති වැ කෙනකු අත් අඩංගුවට ගැනීමට සාම නිලදරුවකුට පිළිවනි.

මෙහි සාම නිලදරුවකු යන වදනට පොලිස් නිලදරුවන් ද, පොලීසියේ වැඩ කටයුතුවලැ යෙදීමට දිසාපතිවරුන් විසින් පත් කැරුණු ගම්මුලාදැනිවරුන් (දැන් ග්‍රාම සේවකයන් ?) ද අයත් වන බව එ මැ සංග්‍රහයෙහි දැක්වේ.

එහි දක්වා ඇති පරිදි මහේස්ත්‍රාත්වරයකු ගේ අණක් හෝ වරෙන්තුවක් හෝ නැති වැ අත් අඩංගුවට ගත හැකි තැන් කිහිපයෙකි.

(1) යමකු සාම නිල දරුවකු ඉදිරියේ සාමය කඩ කළ විටැ. සැමැ‍නි විසින් මෙයින් අදහස් කැරෙනුයේ නීතියක් කැඩීම යි.
(2) ඇතැම් අපරාදවලට සැබැඳි වූ අයත්, එවැන්නකට හවුල් වූ බවට පැමිණිල්ලකට හෝ සැකයකට හෝ ආරංචියකට හෝ ගොදුරු වූ අය.

මේ ගණයට වැටෙන අපරාද කවරේ දැයි 'අපරාධ විධාන සංග්‍රහයේ' පළමු වැනි 'උපලෙඛනයෙන්' පැහැදිලි වේ. 'දණ්ඩ නීති සංග්‍රහයෙහි' එන හැම අපරාදයක් පිළිබැඳි වැ මැ අනුගමනය කළ යුතු පිළිවෙළ එහි දැක්වේ.

මිනී මැරුම, මිනී මැරුමට තැත් කිරීම, සිය දිවි නසා - ගැනීමට තැත් කිරීම, කෙනකුට තුවාළ සිදු කිරීම යන අපරාද වරෙන්තුවක් නැති වැ කෙනකු අත් අඩංගුවට ගත හැකි අපරාදවලට නිදසුන් හැටියට දැක්වියැ හැකි.

(3) නීත්‍යනුකුල හේතුවක් නැති වැ, ගෙවල් බිඳීමට පාවිච්චි කරන කිසි දු අවියක් ළඟැ තබාගත් අය. එ වැනි හේතුවක් ඇද්ද නැද්ද යන්න පෙන්වීමෙ කිස, අවිය ළඟ තබා-ගත් තැනැත්තා වෙතැ පැවැරේ.

(4) වරද කරුවකු හැටියට ප්‍රකාශ කැරුණු අය.

(5) සොරකම් කිරීමෙන් හෝ වෙන යම් වක් පිළිවෙළෙකින් හෝ තමන් අතට පවරා ගන්නා ලදැයි හේතු සහිත වැ සැක කළ හැකි දේපල කිසිවක් තම රැක්මෙ තබාගෙනැ සිටි අය.

ඒ බඩුමුට්ටු ලබාගැනීම සම්බන්ධයෙන් ඔහු වරදක් කළ හ යි සැක කළ හැකි වියැ යුතු.

(6) සාම නිලදරුවකු තම නිල කටයුතු වලැ යෙදීමෙන් වළක්වන අය හෝ නීත්‍යනුකූල අත් අඩංගුවෙකින් පැනැ යන හෝ පැනැ යන්නට තැත් කරන හෝ අය.

(7) යුද, අහස්, නැව් යන තුන් හමුද සේවයෙන් පලා යන කෙනෙකැ යි සැක කළ හැකි අය.

(8) වරෙන්තුවක් නැති වැ අත් අඩංගුවට ගත හැකි විදියේ වරදක් කිරීමෙ අදහසින්, තමන් එහි සිටින වග සැහැවීමට තැත් කරන අය්.

වරෙන්තුවක් නැති වැ සැක කරුවකු අත් අඩංගුවට ගත නොහැකි යැයි කියා තිබෙන වරදවලැ දී පවා වරෙන්තුවක් නැති වැ කෙනකු ඇල්ලීමට සාම නිලදරුවකුට පිළිවනි. ඒ වෙසෙසි විටෙක පමණි. වරෙන්තුවක් නැති වැ ඇල්ලීමට තුඩු නො දෙන වරදක් ගැනැ චෝදනා ලත් තැනැත්-තකු තමා ගේ නම හා පදිංචිය කිමෙක්දැයි සාම නිල දරුවකුට කීමට එකඟ නුවුවහොත් ඔහු අල්ලා-ගැනීමට නිලදරුවාට පිළිවනි. ඒ තැනැත්තා තමා ගේ යැ යි දුන් නම හා පදිංචිය බොරු බව නිල දරුවාට හැඟී ගිය විටැ ද මේ පිළිවෙළ අනුගමනය කළ හැකි යි. අත් අඩංගුවට ගනු ලැබුණු තැනැත්තා තමා ගේ නියම නම හා පදිංචිය දුනහොත් ඇවැසි නම් මහෙස්ත්‍රාත් උසාවියේ පෙනී සිටින බවට දිවුරුම් දෙන ඇප ඔප්පුවක් පිටැ ඔහු නිදහස් කැරැ යැවීමට ඉඩ ඇත්තේ යි. එ සේ නැති නම් පැ විසි හතරක් ඇතුළතැ දී පෙදෙසේ කිට්ටු මැ මහෙස්ත්‍රාත් උසාවිය වෙතැ ඉදිරිපත් කළ යුතු වේ.

ඉහතැ දැක්වුණු අවස්තා හැරැ වරෙන්තු-වක් නැති වැ ඇල්ලියැ හැකි තවත් තැනෙකි. වරෙන්තුවක් පිටැ පමණක් අත් අඩංගුවට ගැනීමට නීතියෙන් ඉඩ සලසන තැනෙකැ සැක කරුට මෙහි තිර පදිංචියක් නැති බව හෝ සැකකරු දිවයිනෙන් පිට වී යාමට තැත් කරන බව හෝ සාම නිල දරුවකුට පෙනී ගිය හොත් ඔහු අත් අඩංගුවට ගැනීමට ඔහුට බලය තිබේ.

එ සේ අල්ලාගනු ලැබූ තැනැත්තකු එ වේලේ මැ මහේස්ත්‍රාත්වරයකු වෙතැ ඉදිරිපත් කළ යුතු වේ. උසාවියේ පෙනී සිටින ලෙස අණ කොටැ ඇප ඔප්පුවක් පිටැ නිදහස් කිරීමට හෝ අත් අඩංගුවෙහි මැ රඳවා-ගැනීමට අණ කිරීමට හෝ මහේස්ත්-රාත්වරයාට බලය තිබේ.

අන්තිමට විතර කැරුණු අවස්තා දෙක හැරෙන්නට අනෙක් හැම අවස්තාවෙකැ දී මැ අත් අඩංගුවට ගනු ලැබුණු තැනැත්තාට කළ යුත්තේ කිමෙක් දැ යි සලකා බලමු. 'අපරාධ විධාන සංග්‍රහයේ' හැටියට ඒ වරද පිළිබැඳි වැ නඩුව ඇසීමට බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙතැ සැක කරු ඉක්ම-නින් ඉදිරිපත් කැරුම මී ළඟට සිදු වියැ යුතු යි. මෙ කිස සඳහා සාම නිලදරුවකුට ලැබෙන්නේ වැඩි මැ විසින් පැය විසි හතරෙකැ කාල සීමාවෙකි. මහේස්ත්‍රාත්-වරයා සිටින තැනට යාමට ගත වන කාලයත් මෙයට අඩංගු වේ.

අත් අඩංගුවට ගැනුණු තැනැත්තා ඇප පිටැ නිදහස් කැරුම හෝ අත්අඩංගුවේ තැබීම හෝ ගැනැ තීරණය වූ පසු මී ළඟ කිස වනුයේ නඩුව යි.

මෙ ලිපියේත් ''මෙයට පෙරැ ලිපියේත් සලකා බැලූ ක්‍රමවලින් එකක් වහල් කොටැ-ගෙනැ සැක කරු උසාවියට ඉදිරිපත් කැරුණා යැ යි සිතා, එ තැන් සිටැ නඩුවේ අනෙක් කොටස් ගැනැ සැලැකිල්ල යොමු කරමු.

මහේස්ත්‍රාත් උසාවියේ නඩු දෙ විදියෙකි. මහේස්ත්‍රාත්වරයා විභාග කොටැ දඬුවමක් නියම කළ හැකි නඩු කොටසෙක් ද, දිස්ත්‍රික්ක උසාවියට හෝ 'ශ්‍රෙෂ්ඨාධිකරණ-යට' හෝ විබාග කිරීමේ බල ඇති, එහෙත් මහෙස්ත්‍රාත් උසාවියේ මූලික පිරික්සුම් පැවැත්වෙන නඩු කොටසෙක් ද වේ.

පළමු ගණයට වැටෙන නඩු අසන පිළිවෙළ දැන් සලකා බලමු. සැක කරු වරෙන්තුවක් නැති වැ අත් අඩංගුවට ගැනුණේ නම් ඔහු උසාවියට ඉදිරිපත් කැරුණු විටැ මහේස්ත්‍රාත්වරයා කළ යුත්තේ, සැකකරු ගෙනා තැනැත්තාත් නඩුවට සැබැඳි කරුණු ගැනැ දන්නා, උසාවියේ සිටින වෙනත් අයත් දිවුරුමක් පිටැ, පැන අසා, පිරික්සීම යි. ඉන් පසු නඩුවක් පැවැරීමට සෑහෙන කරුණු ඇතැ යි හැඟුණහොත්, විත්ති කරුට විරුදු වැ

'චෝදනා' සැකැසීම (Frame) මහේස්ත්‍රාත් වරයා ගේ මී ළඟ කිස යි.

වරෙන්තුවක් හෝ සිතාසියක් හෝ පිටැ සැක කරු උසාවියට පැමිණි විටැ අනුගමනය කැරෙනුයේ වෙන මැ ක්‍රමයෙකි. එ වැනි තැනෙකැ දී චෝදනා සැකැසීම සිදු නො වේ. වරෙන්තුවේ හෝ සිතාසියේ හෝ අඩංගු වරද පිළිබඳ විතර චෝදනාව හැටියට ගණන් ගත හැකි බව 'අපරාධ විධාන සංග්‍රහයෙහි දැක්වේ.

මහේස්ත්‍රාවරයා විසින් මින් පසු කැරෙනුයේ චෝදනා කියැවීම යි. දෙ වනු වැ සඳහන් කරන ලද අවස්තාවේ දි ඔහු කියවන්නේ වරද පිළිබඳ විස්තර අඩංගු වරෙන්තුවේ හෝ සිතාසියේ හෝ ඇති පැවැසුම යි.

මෙ චෝදනා පිටැ ඔහු වරද කරු නො-කිරීමට කරුණු ඇද්ද යි මහේස්ත්‍රාත්වරයා විසින් මී ළඟට අසනු ලැබේ.

එහෙත් එක් වෙසෙසි තැනෙකි. පැමිණිල්-ලක් හෝ ආරංචියක් හෝ ලැබීම නිසා පොලිස් නිලදරුවකු හෝ වෙනත් සාම නිලදරුවකු හෝ පැවැත්වූ පිරික්සුමක් ගැනැ ලියැවුණු සැළයක් පිටැ පැවැරුණු නඩුවෙකැ දී, ඒ වරද තුන් මසෙකැ හිර දඬුවමකට හෝ රුපියල් පනහක දඩයකට හෝ යටත් වියැ හැකි එකක් බව මහේස්ත්‍රාත්වරයාට පෙනී-ගිය හොත් චෝදනාවක් හැටියට ඒ සැළය වරද කරුට කියැවීමටත් ඉන් පසු දඬුවම් නොකිරීමට හේතු කවරේ දැ යි ඔහු ගෙන් ඇසීමටත් මහේස්ත්‍රාත්වරයාට ඉඩ ඇත්තේ යි.

දඬුවම් නොකිරීමට හේතු ඇසුණු විටැ, තමා වරද කරු බව පැහැදිලි වැ දැක්වෙන පරිදි විත්ති කරු විසින් පැවැසුමක් කරන ලද නම්, ඒ පැවැසුම, හැකි පමණ ඔහු ගේ වදනින් මැ සටහන් කොටැ, ඔහුට විරුද්ධ වැ දඬුවමක් නියම කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය ඇති. ඒ දඬුවම ද සටහන් කැරැ තැබියැ යුතු බව 'අපරාධ විධාන සංග්‍රහය' කියයි.

එ වැනි පැවැසුමක් විත්තිකරු විසින් නො කැරුණු විටැ කළ යුත්තේ කිමෙක් දැ යි මී ළඟට සොයා බලමු.

ඔබට ඔබ ගේ දැනුම ගැනැ සැක ද?

එ සේ නම් තිසැක දැනුම සඳහා

දැනුම කියවන්නැ

කලබෙකැ මිල රු. 1.00 යි. කලප් 12 ක් සඳහා රු. 10.00 යි.

කොළොඹ - 1, ගෆූර් ගොඩනැගිල්ල 29 1/9

දැනුම ප්‍රකාශකයෝ

බිණර මස

ඇසළෙහි අස්වැන්න කපා පාගා-ගත් පසු නිකිණියෙහි කමත් අස් කොටැ ඇළ වෙළි වැව් අමුණු පාද පිරිසුදු කරන බව කියැවිණි. කුමට එ සේ කුණු අස් කෙරෙද්ද? ඊළඟට එනුයේ වැසි මස හෙයින් ඒ එන අහස් දිය රඳවා පිළිගැනුම සඳහා එ සේ කෙරෙති.

මේ වැසි මස ද එ සේ මෙ සේ වැසි මසෙක් නො වේ. බිය හෙණ කර මසෙකි. මේ බිය හෙණ කර යනු කට වහරින් බිණර වූ සේ යැ. නැත, මේ වදන් තුනෙහි මුල මැද අග අකුරු ගෙනැ මසෙහි නම බිණර යැ යි හඳගනු ද නොබැරි යැ. "මෙහනසා බස්ස මාලා" යන සකු තෙ වදනෙහි මුල මැද අග තුන'කුර ඈඳීමෙන් තැනුණු "මේබලා" යනු මෙහි ලා සිහි කරනු වටී. එ සේ මැ මිය උඩුහුරු යනු මියුඩුහුරු>මියුඩුරු> නියුඩුරු>නිහඩුරු ඈ සැටියෙන් ද, "හිස බාගත් අත" යනු හිස බාගතත>ඉහබාගතත >ඉබාගාත යන සැටියෙන් ද වහරින් වෙනස් වී නම් බිය හෙණ කර යන්න මැ වුව ද වහරින් බිණර වීම නොබැරි යැ.

ඇතැම්හු බිණර යනු බිනර යැ යි ද ලියති. එහෙත් හෙළ බසෙහි සන්දි නියර අනුවැ බලන විටැ පෙනෙනුයේ බිනර යනු වැරදි බවත් බිණර යනු මැ හරි බවත් යැ.

නිද. වනුරු > වඳුරු
කිනුරු > කිඳුරු
පණුරු > පඬුරු
පරණල > පරඬල
තමුරු > තඹුරු
බමර > බඹුරු

ඈ තැනින් පෙනෙනුයේ න්, ණ්, ම් යන නැහැසි අකුරුවලට ගොස'කුරු අගම් වීමෙහි දී පිළිවෙළින් එනුයේ ඒ ඒ වගට මැ අයත් වූ ද්, ඩ්, බ් යන අකුරු බව යි.

මෙ අනුවැ බිණර යනු ගම් වහරේ බිඩර යැ යි ද කියැවෙන හෙයින් මේ මස බිනර නො වැ බිණර බව මැ පැහැදිලි යැ.

රුසැයුම් තරගය

දූහුනන් සඳහා යැ.

දිනූ පබඳ පළ වේ. තෑගි ලැබේ.

ගැදි තරගයට මැය

දඹදිවියන් හෙළ දිවේ පිරෙනු බලා අද ගැමුණුවනට පහළ වන සිතිවිලි

තෑගි දෙන්නෝ

මහනුවර 'ධර්මරාජ' විදුහලේ ඇදුරු, හරිශ්චන්ද්‍ර විජයතුංග සුරීහු යි.

පැදි තරගයට මැය

කෙළි පිටියේ ම දවස ගෙවන දරුවකුට මවක කරන අවලාදය

තෑගි දෙන්නෝ

මාතර සාන්ත තොමොසු විදුහල් පති, කු. බේ. ජයසූරිය සුරීහු යි.

එඩියට එවන සියලු පැබැඳුම්
ගල්කිස්සේ, හුළුදගොඩ පාරේ 20/1
එඩියෙහි සකසුවන් නමට එවුව මැනැවි.